# 2019/01/08 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2019/01/08 දින පෙ.ව. 9.00 ට  නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුසංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | වී.ජී.අරුණ ශාන්ති මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 27. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

## 01. ආගම සිහි කිරීම

2019.01.08 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර  විනාඩි 01 ක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

සුභ උදෑසනක් වේවා සියලුම දෙනාට. 2019 වර්ෂයේ නාගොඩ ප්‍රාදේශීය සභාවේ පළවෙනි රැස්වීම පැවැත්වෙන අද දින පැමිණ සිටින උප සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා ඉතා ගෞරවයෙන් පිළිගනිමින් 2019 ජනවාරි මාසයට අදාල සැසි වාරය ආරම්භ කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒවගේම මෙහිදී මම විශේෂ ඉල්ලීමක් කරනවා. ඔබතුමන්ලා ඔබතුමියන්ලා අදහස්, උදහස් ප්‍රකාශ කිරීමේදී පෞද්ගලික මතිමතාන්තරවලින් තොරව බල ප්‍රදේශයට අපට වැදගත් වූ යෝජනා සම්බන්ධව කතාබහ කරන ලෙසත් ඉල්ලා සිටිනවා.

**03. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

- ගල්ලෙන මුල්ල මාර්ගය සඳහා කොරිපස් ප්‍රවාහනය කිරීම වෙනුවෙන් ගෙවා ඇත්තේ රු. 7000.00 ක් වුවත්, එය සභා වාර්තාවේ රු. 8000.00 ක් ලෙස සඳහන් වී ඇත . එය රු. 7000.00 ක් ලෙස නිවැරදි විය යුතුයි.
- උඩවැලිවිටිය ශ්‍රමදාන මාවතෙත් කොරිපස් ප්‍රවාහනය වෙනුවෙන් සභා වාර්තාවේ රු. 8000.00 ක් ලෙස සඳහන් වී ඇත . එය රු. 7000.00 ක් ලෙස නිවැරදි විය යුතුයි.

**04. 2018.12.11 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

පෙන්වා දෙන ලද සංශෝධනයට යටත්ව සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**05. විශේෂ නිවේදන**

01. දකුණු පළාතේ පළාත් පාලන කාන්තා නියෝජිතවරියන් දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා ගරු මහජන නියෝජිතවරියන් සහභාගී කරවන ලෙස දන්වා පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් 2018.12.24 දිනැතිව යොමු කරන ලද ලිපිය සභා ගත කරන ලදී.

02. පසුගිය මහා සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම පරිදි ප්‍රාදේශීය සභාව ඉදිරිපත් වන හා ගෙවීම් කරන නඩු පිළිබඳ විස්තර වාර්තාවක් සභා ගත කරන ලදී.

**06. සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. සිසිර කුමාර සමරවිකුම මහතා විසින් මාපලගම බස් නැවතුම්පොලේ අලුතින් ඉදි කිරීමට යෝජිත වැසිකිලි පද්ධතිය සම්බන්ධව අතිගරු ජනාධිපතිතුමා වෙත යොමු කරන ලද ලිපියෙහි පිටපත සභාගත කරන ලදි.

02. මාපලගම බස් නැවතුම්පොල පොදු වැසිකිලිය ඉදිකිරීම සම්බන්ධව දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් යොමු කරන ලද 2018.11.14 දිනැති ලිපිය සභාගත කරන ලදී

03. තිලක් මෝටර්ස්, යටලමත්ත විසින් යොමු කරන ලද ප්‍රාදේශීය සභාව සතු සියළු වාහන අළුත්වැඩියා කිරීම සඳහා ඉල්ලීම් කරන ලද 2018.12.31 දිනැති ලිපිය සභාගත කරන ලදී.

04. පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් යොමු කරන ලද 2018.12.13 දිනැති වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම - 2018 ලිපිය සභාගත කරන ලදී.

05. දකුණු පළාත් සභා මන්ත්‍රී ඉසුරු දොඩංගොඩ මහතා විසින් යොමු කරන ලද 2018.12.10 දිනැති උපමාන පාදක ප්‍රදාන ( මන්ත්‍රී ප්‍රතිපාදන) සංවර්ධන සැළැස්ම 2018 යෝජනා ලබා දීම සම්බන්ධ ලිපිය සභා ගත කරන ලදී.

06. උඩවැලිවිටිය, නාගොඩ එම්. එම්. රසිකා චාන්දනී මහත්මිය විසින් ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඉනෝකා විජේවර්ධන මහත්මිය මගින් 2019.01.08 දිනැතිව යොමු කරන ලද කැප්පිටියගොඩ අංගහ තොටුපල සඳහා බෝට්ටුවක් ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

**07. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**
**නැත.**

**08. යථා පරිදි කල් දී ඇති යෝජනා**

**8.1 ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා**

I. නාගොඩ ප්‍රාදේශීය සභාවට අයත් මාපලගම වෙළඳ සංකීර්ණයේ උඩුමහළ කඩකාමර අංක 06ට විදුලි සැපයුම ලබා දීමට සහ අඩුපාඩු සකස් කිරීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදී.**

**II.** 2017 වර්ෂයට අදාලව තල්ගස්වල බදාදා සතිපොළෙහි සතියක බදු වාරිකය හා දඩ මුදල නිදහස් කිරීමට යෝජනා කරමි.
**සභාවේ ඒකමතික තීරණය අනුව බදු වාරිකය නිදහස් නොකිරීමට තීරණය කරන ලදී.**

III. නාගොඩ ප්‍රාදේශීය සභාවට අයත් මාපලගම වෙළඳ සංකීර්ණයේ බිම් මහලේ අංක 01,02,03,04 සහ උඩුමහලේ අංක 01,03 කාමරවල හිඟ කඩ කුලීය පියවන තෙක් මුද්‍රා තැබීමට යෝජනා කරමි.
ගරු සභාපතිතුමා විසින් සභාවට පෙන්වා දෙන ලද සභාවට අය විය යුතු මුදල් ලබා ගැනීම සඳහා පළමු, දෙවන, තෙවන සිහි කැඳවීම් යවා කඩ මුද්‍රා තැබීමට ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් යෝජනා කරන ලදී
**එම යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදී.**

IV. ප්‍රාදේශීය සභාව සතු ආදායම් බලපත්‍ර ලබා නොගත් පහත සඳහන් වාහන සඳහා ආදායම් බලපත්‍රය ලබා ගැනීමට යෝජනා කරමි.

- RD 1637 ට්‍රැක්ටරය
- RA 8570 ට්‍රැක්ටරය
- RA 8569 ට්‍රැක්ටරය
- RX 2239 සුදු යකඩ බවුසරය
- RD 9457 ට්‍රැක්ටරය
- RW 9115 බවුසරය ( ට්‍රේලරය)
- RW 9116 බවුසරය ( ට්‍රේලරය)
- RV 5013 ට්‍රේලරය
- SC 3570 හෑඩිමෙක් ට්‍රැක්ටරය
- 340-4321 අත් ට්‍රැක්ටරය

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරන ලදී.**

V. විදුලි බිල්පත්, ජල බිල්පත් හා දුරකථන බිල්පත් නියමිත දිනට නොගෙවීම නිසා ඒ සඳහා පොලී මුදලක්ද එකතු වන අතර මුදල ගෙවීම හිඟ වීම නිසා විසන්ධි කිරීමට සිදු වේ. ඊට දඩ මුදලක්ද ගෙවීමට සිදු වේ. එබැවින් බිල්පත් ලද විගස මාස්පතා නියමිත දිනට මහා සභාවේ ආවරණ අනුමැතිය යටතේ ගෙවීම් කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී වී.වී. සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදී.**

VI. ඇප්තොප්වත්ත ඉඩමේ පොල් කැඩීම නිසා එක් ගසකට රු. 100.00 ක් වැය වන අතර එම මුදල මුදල් කර එම දිනයේම අදාල පුද්ගලයාට ගෙවිය යුතුය. ඒ සඳහා රු. 10000.00 ක මුදලක් වෙන් කර ගැනීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කරන ලදී.**

VII. නාගොඩ ප්‍රාදේශීය සභාව සතු LL 7103 ටිපර් රථය PF 7360 කැබ් රථය, 252-6478 කැබ් රථය, සහ කෘ කැබ් රථය සඳහා ඉන්ධන සපයා ගැනීමට නාගොඩ තෙල් පිරවුම්හල වෙත යොමු කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

VIII. 2019 වර්ෂය සඳහා නාගොඩ ප්‍රාදේශීය සභාව මගින් පාලනය වන පෙර පාසල් 15 ට ඇතුලත් වන පෙර පාසල් දරුවන් වෙනුවෙන් නිල ඇඳුමක් සභාව මගින් නොමිලේ ලබා දීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදී.**

IX. පෙර පාසල් 15 සඳහා පෙර පාසලේ නම සහිත නාම පුවරු සවි කර නොමැති බැවින් ප්‍රාදේශීය සභා නම සහිත පෙර පාසල් නාමපුවරු 15 ක් සෑදීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරන ලදී.**

X. සේවක සුභ සාධනය සඳහා අයවැයෙන් වෙන් කර ඇති රු. 100000.00 ක මුදල වියදම් කිරීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරන ලදී.**

XI. නාගොඩ ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සඳහා අධ්‍යයන චාරිකාවක් වෙනුවෙන් රු. 200000.00 ක මුදලක් ලබා දීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරන ලදී.**

XII. නාගොඩ ප්‍රාදේශීය සභාව සතු PF 7360 දරණ කැබ් රථයේ ක්ලච් ප්ලේට් සහ පිටුපස බ්‍රේක් ලයනර් යොදා ඔයිල් කුලරයේ කාන්දුවීමක් ඇති බැවින් අළුත්වැඩියා කිරීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදී.**

XIII. මුදල් ගෙවීමේ වාර්තාව ඉදිරිපත් කිරීම

**2019.01.08 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.**

**ඉදිරි ගෙවීම් (පොදු අරමුදල්)**

**01.2018 දෙසැම්බර් මස විදුලි බිල්පත්**

8616373802 - උඩුගම පොළ - රු. 240.00
8616374000 - උඩුගම ටොයිලට් කම්ප්ලෙක්ස් - රු. 240.00
2810125104 - දීප්ති පෙර පාසල - රු. 276.60

**02.ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය**

33/53/003/008/11 - උඩුගම උප කාර්යාලය (2018.11.17 – 2018.12.18) -රු. 1394.00

**03.ලේකම්, නාගොඩ ප්‍රාදේශීය සභාව**

I. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2018 දෙසැම්බර් මස ඉන්ධන දීමනා ලබා දීමේ බිල්පත පියවීම -රු.81000.00

II. 33/53/003/008/11 උඩුගම උප කාර්යාලය (2018.07.18 – 2018.08.17) ජල බිල්පත් මුදල් ප්‍රතිපූර්ණය කිරීම -රු. 5600.00

III. පළාත් නිශ්චිත 2018 ප්‍රජා ජල සම්පාදනය යටතේ සෘජු ශ්‍රමික කර්මාන්තයක් ලෙස ක්‍රියාත්මක කරන ලද ආයුර්වේද මධ්‍යස්ථානයේ ජල සැපයුම් හා සනීපාරක්ෂක වැසිකිලි පද්ධතිය ස්ථාපනය කිරීම කර්මාන්තයේ කම්කරු කුලීය පොදු අරමුදලින් ගෙවීම (රජයේ ආධාර ලැබුණු පසු ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත) - රු. 9800.00

**<u>04.අතිකාල දීමනා ගෙවීම</u>**

**<u>2018 දෙසැම්බර් මස</u>**

| | | |
|---|---|---|
| එච්.එම්.හේවාවිතාන මෙය | - කළමනාකරණ සහකාර | - රු.1550.00 |
| ජී.පී.පී.ශ්‍රීනිකා මෙය | - කළමනාකරණ සහකාර | -රු. 697.41 |
| යූ.වී.මධුර ප්‍රභාත් මයා | - කළමනාකරණ සහකාර | -රු. 1443.00 |
| ඞී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු.6198.75 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු.5250.00 |
| එන්. එම්. රජිත මයා | - අනියම් මුරකරු | - රු.3750.00 |

**05.2018 දෙසැම්බර් මස පරිවර්ජිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සදහා)**

| | | |
|---|---|---|
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 4000.00 |
| කුසල් අසංක එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 4000.00 |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී | -රු. 3000.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | - ආදායම් පරීක්ෂක | -රු . 3000.00 |

**06. යූ.කේ.ජයන්ත මයා, ම.සෞ.ප**

I. ආහාර පනතේ නඩු සදහා බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම වෙනුවෙන් ගෙවීම (2018/12/14) - රු. 500.00

II. ආහාර පනතේ නඩු සදහා බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම වෙනුවෙන් ගෙවීම (2018/12/07) - රු. 500.00

**07.ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2018 දෙසැම්බර් මස දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම -රු.28500.00

ii. 2018 දෙසැම්බර් මස සභා වාර්තා පිටපත් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම - රු. 3120.00

**08.** **අයි ඇන්ඩ් ආර්. ටෙලිකමිනිකේෂන් සොලියුෂන්, කොළඹ 10**
රැස්වීම් ශාලාවේ ශබ්ද විකාශන පද්ධතියේ ඇම්ප්ලෆයරය ඩෙලිගේඩ් යුනිට් 3
අළුත්වැඩියා කිරීමේ බිල්පත - රු. 24000.00

**09 ඩබ්. ඩබ්. පී. එම් ප්‍රනාන්දු මිය,නාගොඩ ප්‍රාදේශීය සභාව**
නාගොඩ ප්‍රාදේශීය සභාවේ ආයුර්වේද වෛද්‍ය ලෙස සේවය කරන ඩබ්. ඩබ්. පී. එම් ප්‍රනාන්දු මහත්මිය 2015.01.01 දින සිට ආයුර්වේද වෛද්‍ය 2 ශ්‍රේණියට උසස් කිරීම හේතුවෙන් අදාල වැටුප් තලයේ පිහිටුවීමේ හා 2016.01.01 දින සිට අදාල වැටුප් පරිවර්තන සිදු කිරීමේ හිඟ වැටුප් මුදල් ගෙවීම.(පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් ප්‍රතිපූර්ණය කර ඇත.) - රු. 121403.40

**10.බී.ජී. කරුණාරත්න මයා, රත්නගිරි ස්ටෝර්ස්, මාපලගම**
මාපලගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2018 දෙසැම්බර් - රු. 5120.00

**11.එම්.ඒ.සිරිපාල,සේසිරි ස්ටෝර්ස්,මාපලගම**
මාපලගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2018 දෙසැම්බර් - රු. 2970.00

**12.එච්.එල්.කේ. ශ්‍රිනිත් රුක්ෂාන්, උඩුගම**
උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2018 දෙසැම්බර් - රු. 5520.00

**13.යසෝධරා රශිණි නාගොඩ විතාන,ආනන්දගිරි,නාගොඩ ගාල්ල**
ගරු සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරීනිය සඳහා මාසික දීමනා ගෙවීම(රු.13000 බැගින්)
(2018 ජුනි,ජූලි,අගෝස්තු,සැප්තැම්බර්,ඔක්තොම්බර්,නොවැම්බර්,දෙසැම්බර්) -රු.91000.00

**14. ආර්.ඩබ්. මිත්‍රපාල මයා, පොරවගම**
නාගොඩ ප්‍රාදේශීය සභා පුස්තකාල 03 සඳහා බෙරලිය මල් ග්‍රන්ථය
මිළදී ගැනීමේ බිල්පත - රු. 1296.00

**15. ජයන්ත ඉලේපෙරරුමආරච්චි, ජේ.පී. කමියුනිකේෂන්, නාගොඩ**
2019 අයවැය පිටපත් 07 ක් සකස් කිරීම සඳහා පරිගණක වර්ණ පිටපත් ලබා ගැනීම-රු. 1260.00

**16.පොදු අරමුදල් කර්මාන්ත**
**ඒ. කේ. ජානක ගයාන් සංජීව, ගයාන් එන්ටර්ප්‍රයිසස්, යටලමත්ත**

i. යටලමත්ත විනිමුල්ල කන්ද මාර්ගය JCB යන්ත්‍ර යොදා සංවර්ධනය කිරීමේ බිල්පත පියවීම. මීටර් පැය 22 - රු. 55000.00

**17. සී/ස බද්දේගම බ. ප්‍රාදේශීය සංවර්ධන සමූපකාර සමිතිය, බද්දේගම**

i. හියුම් පයිප්ප ලබා ගැනීමේ බිල්පත - රු. 19400.00
ii. ලෙහුවල බෝ ගහ මාර්ගය සඳහා හියුම් පයිප්ප ලබා ගැනීමේ බිල්පත - රු. 14550.00
iii. ගල්ලන්දල ඇල ඉහළ මාර්ගය සඳහා හියුම් පයිප්ප ලබා ගැනීමේ බිල්පත - රු. 35100.00

**18. එන්.වී. නාමල් ලක්රුවන්, ගෝණදෙනිය**

උඩුගම 218 C මොරගල්මුල්ල කාබිල්වත්ත මාර්ගය සංවර්ධනය කිරීම සඳහා J.C.B. යන්ත්‍රය යොදා ගැනීම සඳහා ගෙවීම් (මීටර් පැය 11) - රු. 37500.00

**19. එස්.ඩබ්.සී. ප්‍රියදර්ශනී මහත්මිය,**

i. උඩුගම අළුත්වත්ත උඩුගම කැල්ල මාර්ගය සංවර්ධනය සඳහා J.C.B. යන්ත්‍රය යොදා ගැනීම සඳහා ගෙවීම් - රු. 30000.00
ii. උඩුගම අළුත්වත්ත කැකිරිහේන දොළ මාර්ගය සංවර්ධනය සඳහා J.C.B. යන්ත්‍රය යොදා ගැනීම සඳහා ගෙවීම් - රු. 35000.00
iii. උඩුගම මධ්‍යම 28 මාර්ගය සංවර්ධනය සඳහා J.C.B. යන්ත්‍රය යොදා ගැනීම සඳහා ගෙවීම් - රු. 20000.00

**20. වී.ඒ. ප්‍රදීප් රවීන්ද්‍ර, ප්‍රදීප් කන්ස්ට්‍රක්ෂන්**

මීනුවන්ගොඩකන්ද සර්වෝදය මාවත සංවර්ධනය සඳහා J.C.B. යන්ත්‍රය යොදා ගැනීම සඳහා ගෙවීම් - රු. 15000.00

**21. හෂාන් චාමික ගොඩගම, ශක්ති කන්ස්ට්‍රක්ෂන්**

i. මීනුවන්ගොඩකන්ද සර්වෝදය මාවත සංවර්ධනය සඳහා ෙකාරිපස් ප්‍රවාහනය සඳහා ගෙවීම් - රු. 10500.00
ii. මීනුවන්ගොඩකන්ද සර්වෝදය මාවත සංවර්ධනය සඳහා ෙකාරිපස් ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් - රු. 21000.00
iii. මීනුවන්ගොඩකන්ද සර්වෝදය මාවත සංවර්ධනය සඳහා සිළිංඩර් ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් - රු. 21000.00
iv. මීනුවන්ගොඩකන්ද සර්වෝදය මාවත සංවර්ධනය සඳහා සිළිංඩර් ප්‍රවාහනය වෙනුවෙන් ගෙවීම් - රු. 4000.00

**22. පී.ජී. සමන්ත, පී.ජී. බිලොක්ගල්**

i. කන්ද උඩවත්ත මාර්ගෙය් J.C.B. යන්ත්‍ර යොදා කාණු කැපීම වෙනුවෙන් ගෙවීම් - රු.12500.00
ii. නීල්ද අල්විස් මාවත දෙපස J.C.B. යන්ත්‍ර යොදා සැකසීම වෙනුවෙන් ගෙවීම් - රු. 20000.00
iii. ලෙහුවල බෝගහ අසලින් මාර්ගය සිළිංඩර දමා සැකසීම වෙනුවෙන් ගෙවීම් - රු. 7500.00

**23.** **සී/ස බද්දේගම බ. ප්‍රාදේශීය සංවර්ධන සමූපකාර සමිතිය, පුහුල්දූව**

ලෙහුවල බෝ ගහ අසලින් මාර්ගය සඳහා හියුම් පයිප්ප ලබා ගැනීම - රු. 14550.00

**රජයේ ආධාර (මන්ත්‍රී ප්‍රතිපාදන)**

**24.** **කුරුපනාව ග්‍රාම සංවර්ධන සමිතිය, කුරුපනාව, නාගොඩ**
වාඩිගොඩ නයාමුල්ල මාර්ගය කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ 10%
රැඳවුම් මුදල් ගෙවීම - රු.127688.64

**25.** **මන්ත්‍රී ප්‍රතිපාදන - සුමනසිරි ලියනෙග් මැතිතුමා**
**ඒස්.ඩබ්.සී. ප්‍රියදර්ශනි මිය**

උඩුගම අලුත්වත්ත මිනිරන්වල කන්ද මාර්ගය J.C.B. යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු.30000.00

**ඉදිරි ගෙවීම් වාර්තාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය**

- **8.2 කර්මාන්ත යෝජනා**

  **8.3 ගරු සභාපතිතුමන් හා මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා**

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා**

**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

- **ඌරල උයන අරාලකන්ද පාර සංවර්ධන යෝජනාව වෙනස් කර 70 කන්ද පන්සල මාර්ගය අලුත්වැඩියා කිරීම**

**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් කරන ලද යෝජනා ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

- ගෝණදෙනිය සෞඛ්‍ය මධ්‍යස්ථානයට වාහනයකින් ගමන් කිරීමට හැකිවන පරිදි මාර්ගය සකස් කිරීම

- **2018.12.11 දින පැවති මහා සභාවට යෝජනා කරන ලද ඉහත සඳහන් යෝජනාව සංශෝධනය කර ඒ වෙනුවට පහත සඳහන් යෝජනා 02 ඉදිරිපත් කරමි.**

  - හඟරන්වල ග්‍රාම සේවා වසමේ නොම්මර 4 ප්‍රදේශයේ ඇති කෝවිල් භූමිය ජේ.සී.බී. යන්ත්‍රයක් යොදා සුද්ධ කර පිළිසකර කිරීම

- නාගොඩ ප්‍රාදේශීය සභාව සතු ගෝණදෙනිය මහජන ක්‍රීඩාංගණය වල් බිහි වී කඩතොලු වී කාණු අවහිර වී ඇත. ජේ.සී. බී. යන්ත්‍රයක් යොදා මෙම ක්‍රීඩා පිටිය ප්‍රතිසංස්කරණය කිරීම

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා විසින් කරන ලද යෝජනා ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී එම්.එම්. දිසානායක මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

- ලෙහුවල කන්ද දිසානායක මාවත ප්‍රතිසංස්කරණය කිරීම.

**ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා විසින් කරන ලද යෝජනා ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී එන්.ජී. ගයාන් මධුසංඛ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

- ප්‍රාදේශීය සභා අරමුදලින් සිදු කරනු ලැබූ සංවර්ධන ව්‍යාපෘති සඳහා අනුමත මුදලින් ඉතිරි වී ඇති රු. 17000.00 ක මුදල යොදවා කැටගොඩ කිඹුල්කොටුකන්ද මාර්ගයට කොරිපස් දමා සංවර්ධනය කිරීම

**ගරු මන්ත්‍රී එන්.ජී. ගයාන් මධුසංඛ මහතා විසින් කරන ලද යෝජනා ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. නිශාන්ත මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

- තිරුවානගොඩවත්ත පාළමට ප්‍රවිශ්ය මාර්ගය සකස් කර ගැනීම

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා විසින් කරන ලද යෝජනා ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රිනී කේ.කේ.අයි. නෙරංජලී මහත්මිය විසින් ඉදිරිපත් කරන යෝජනා**

- කැප්පිටියගොඩ අංගහ තොටුපල සඳහා බෝට්ටුවක් ලබා දීම

**ගරු මන්ත්‍රිනී කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය විසින් කරන ලද යෝජනා ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**9. කාරක සභා වාර්තා**

## 9.1 ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

i. ගම්මැද්දේගොඩ මිරිස්පැලහේන්දෙනිය මාර්ගය ජේ.සී.බී. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම - රු. 20000.00
ii. උඩවැලිවිටිතලාව මුක්තවිල මාර්ගය ජේ.සී.බී. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම - රු. 20000.00
iii. කොතේගොඩකන්ද මාර්ගය ජේ.සී.බී. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම - රු. 20000.00
iv. ගල්ලෙනමුල්ල දරඅකුල්කන්ද පාමුල මාර්ගය ජේ.සී.බී. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම - රු. 30000.00
v. මාරකන්ද අලුත්ගම්මාන පාර සිළිංඩර යොදා සංවර්ධනය කිරීම - රු. 20000.00

**ඉහත ඇස්තමේන්තු ගරු මන්ත්‍රිනී සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදී.**

## 9.2 මිළ ගණන් ඉදිරිපත් කිරීම

***ආදායම් පරීක්ෂක පාවහන් යුගල සඳහා ලැබී ඇති මිළ ගණන්***

| විස්තරය | ඒ ආර් එච් එම් මත්ලූබ් ගාල්ල | ඩී එස් අයි ප්‍රදර්ශනාගාරය ගාල්ල | රන්දිකා ෂූ පැලස් ගාල්ල |
|---|---|---|---|
| • පිරිමි ලෙදර් වර්ගයේ පාවාහන් යුගලයක මිළ | රු.3350.00 | රු.3499.90 | රු.3300.00 |
| • මේස් යුගලයක මිළ | රු. 170.00 | රු. 240.00 | රු. 150.00 |

**ආදායම් පරීක්ෂක පාවහන් යුගල සඳහා අඩුම මිළ ගණන් ඉදිරිපත් වී ඇත්තේ රන්දිකා ෂූ පැලස්, ගාල්ල වෙතිනි. ඒ අනුව අඩුම මිළ සළකා බලා භාණ්ඩ මිළදී ගැනීමට තීරණය කරන ලදී. එම යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

*ආදායම් පරීක්ෂක නිල ඇඳුම් මැසීම සඳහා ලැබී ඇති මිළ ගණන්*

| විස්තරය | විරංග ටෙක්ස් ඇන්ඩ් ට්‍රේලර්ස්, ගාල්ල | සකීස් ට්‍රේලර්ස්, ගාල්ල | ගොල් ලයින් ටෙක්ස්ටයිල් ඇන්ඩ් ට්‍රේලර්ස්, ගාල්ල |
|---|---|---|---|
| *ආදායම් පරීක්ෂක නිල ඇඳුම් මැසීම සඳහා වැය වන මුදල (රෙදි සමඟ, බැජ් යොදා)* | රු. 8940.00 | රු.9340 | රු.10340 |

ආදායම් පරීක්ෂක නිල ඇඳුම මැසීම සඳහා අඩුම මිළ ගණන් ඉදිරිපත් වී ඇත්තේ විරංග ටෙක්ස් ඇන්ඩ් ට්‍රේලර්ස්, ගාල්ල වෙතිනි. ඒ අනුව අඩුම මිළ සළකා බලා භාණ්ඩ මිළදී ගැනීමට තීරණය කරන ලදී. එම යෝජනාව ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

*පෙර පාසල් ළමුන්ගේ නිල ඇඳුම් සඳහා ලැබී ඇති මිළ ගණන්*

| විස්තරය | ලෝරන්ස් ෆැෂන්, උඩුගම | සිංහගිරි ස්ටෝර්ස් | මහේන්ද්‍ර ලොරෙන්සුහේවා, 273, මාතර පාර, මාගාල්ල |
|---|---|---|---|
| *පෙර පාසල් ළමුන්ගේ නිල ඇඳුමක මිළ (ගැහැනු, පිරිමි)* | රු. 700.00 | රු. 750.00 | රු. 725.00 |

පෙර පාසල් ළමුන්ගේ නිල ඇඳුම සඳහා අඩුම මිළ ගණන් ඉදිරිපත් වී ඇත්තේ ලෝරන්ස් ෆැෂන්, උඩුගම වෙතිනි. ඒ අනුව අඩුම මිළ සළකා බලා භාණ්ඩ මිළදී ගැනීමට තීරණය කරන ලදී. එම යෝජනාව ගරු මන්ත්‍රි රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 10. ලැබීම් හා ගෙවීම් වාර්තා

## 11. වෙනත් කරුණු

### ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා

ගරු සභාපතිතුමනි, නියෝජ්‍ය සභාපතිතුමනි, විපක්ෂනායකතුමනි, සියලු මන්ත්‍රීවරුනි, සියලු මන්ත්‍රීවරියනි, ලේකම්තුමිය ඇතුළු අනෙකුත් නිලධාරීන් සියලු දෙනාගෙන් අවසරයි. මා හට මෙම ස්ථානයට ඒමට ප්‍රමාද වුණේ සභාපතිතුමාටත්, උප සභාපතිතුමාටත්, විපක්ෂ නායකතුමාටත්, වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාවට එන්න කියලා පළාත් පාලන ඇමති තුමා විසින් දැනුම්දීමක් කර තිබුණා. මෙතුමට යන බැරිවුනත් සභා කිහිපයකින් ඇවිල්ල තිබුනා. මම පළමුවෙන්ම සුබ පතනවා පළාත් පාලන අමාත්‍යාංශය, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය, අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශය, ගාලු දිස්ත්‍රික්කයේ අපට හිතවත්, අපි බොහොම ගරු කරන හොඳ දේශපාලන නායකත්වයක් ලබා දෙන, ගරු වජිර අබේවර්ධන මැතිතුමාට ලැබීම පිළිබඳව. ඒ වගේම අපේ නායකතුමාට, අගමැතිතුමාට අපි ඒ පිළිබඳව අපේ ගෞරවය පුද කරනවා. මොකද හොඳ වැඩක් කරන්න පුලුවන්, දැක්මක් තියෙන දක්ෂ ඇමතිවරයෙකුට පළාත් පාලන විෂය භාර දීම් පිළිබඳව. එතුමා යම්කිසි වැඩක් කරන්න පුලුවන්, නිර්මාණශීලී භාවයක් තියෙන, මොරටුව විශ්වවිද්‍යාලයෙන් ඉංජිනේරුවරයෙක් විදියට එළියට එන පුද්ගලයෙක්. එතුමාට ඒ පිළිබඳ දැනුම තියෙනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, මොනවහරි කරල දෙන්න. අපි ඔබට උදව් කරන්නම්. මොකද මෙතුමා අපට පහුගිය දවස්වල වීදි ලාම්පුවක්වත් දුන්නේ නැහැ. නමුත් අපි කියනවා දැන් එකසිය ගණන්වලින් අපි දෙන්නම්. ප්‍රාදේශීය සභාවක් හැටියට කිසිදු වත්කමක් නැති ප්‍රාදේශීය සභාවක් තමයි මේක. ඒ නිසා අපිට කරන්න තියෙන එකම දේ තමයි පළාත් පාළන අමාත්‍යාංශයෙන් යමක් රැගෙන ඒම විශේෂයෙන්ම මම කියනවා අපට ඒ ශක්තිය තිබෙනවා කියලා. ඒ වගේම ලොකු මුදලක් මේකට ගන්න පුළුවන් කියලා විශ්වාසයකුත් තියෙනවා. මෙවර පළාත් පාලන ඇමැතිවරයා සියලුදෙනාට එක විදියට සලකනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා මේ ප්‍රදේශය දියුණු කරගන්න ඔබට ලොකු සහයක් අපට දෙන්න පුළුවන්. පාරවල් විතරක් නෙවෙයි, නගර සැලසුම් කරලා නගර දියුණු කරගන්න අවස්ථාවක් කරගන්න පුළුවන්. හැබැයි ඔබ බය වෙන්න එපා. පස්සට යන්න එපා. ඇමැතිතුමා අඳුනන්නේ නැහැ කියලා. අපි කුහක වෙන්නෙත් නැහැ. ගේන්න පුලුවන් සියලුම මුදල් මේ ප්‍රාදේශීය සභාවට අරං ඇවිල්ලා දෙන්නම්. ඵලදායි විදියට සමාජයට ඉස්සරහට කරන්න පුළුවන්, ඉදිරියට වටිනා වැඩ ටිකක් අපි ඉක්මනින් කිරීමට කටයුතු කරමු. එතුමා ඊයේ කිව්වා ළමා උද්‍යාන කීපයක් ඉක්මනින් හදලා දෙන්නම් කියලා. එනිසා අපි ඒවා හරි තැන් වල ඇති කරමු. මමත්වයට වැඩ කරන්නෙ නැතුව වැඩියෙන් පහසුකම් දෙන්න පුළුවන්, වැඩියෙන් පාවිච්චි කරන, වැඩියෙන් ළමයින්ට සේවයක් වන, සමාජයට සේවයක් වන තැන්වල ඒවා සිදු කරමු. ඒ නිසා අපි සියලු දෙනාගේ යෝජනා අරගෙන කළ හැකි දේ කරමු. ඒ සහයෝගය අපට දෙන්න. අපි ඔබට මුදල් ගෙනත් දෙන්නම්.

ඒ වගේම යටලමත්ත ප්‍රදේශයේත්, නාගොඩ ප්‍රදේශයේත් මේ දහතුන්වැනිදා පාලම් හයක් මුල්ගල් තියෙනවා. එදාට ගරු සභාපතිතුමනි, අපට ඔබතුමාගේ සහයෝගය ඕන. පොඩි පාරවල් දෙකක් විතර තියෙනවා. සුද්ධ කරගන්න. ඒ වගේම අපේ විජිත් මහත්තයාගේ නිවස අසල පාලමේ පොඩි ප්‍රශ්නයක් තියෙනවා. ඒ අය කැමති නැහැ පාරක් තව පාරකට සම්බන්ධ වෙන්නේ නැතුව පාලම දාන්න. පාර කපලා දෙනවා නම් ඒ ගැන සලකා බලන්නම් කියලා තමයි කියන්නේ. නමුත් මම දිගින් දිගටම මේක කරලා දෙන්න කියලා ඉල්ලීම් කළා. මේ සඳහා ලක්ෂ 140, 150ක් විතර යනවා. ඒ නිසා ඒ වගේ මුදලක් පාරක් නැති තැනකට දාන්න බැහැ කිව්වා. උඩලමත්ත අපේ සුසන්ත මන්ත්‍රීතුමාගේ ගමේ, යටලමත්තෙ ඉනෝකා මන්ත්‍රීතුමිය ඉල්ලුම් කල මිදිගහවිට,අපේ සුභාෂි මන්ත්‍රීතුමියගේ ගමේ මේ පාලම්වලට මුල් ගල් තියෙනවා.එදිනට ඔබතුමාට හා සියළු දෙනාට සහභාගි වන ලෙස ආරාධනා කරමින් සියළු දෙනාට සුභ දවසක් ප්‍රාර්ථනා කරනවා.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමාගෙන් ද, ලේකම්තුමියගෙන්ද, සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. ලැබුවා වූ නව වසර සුබ වසරක් වේවා යි ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම අපේ නිශාන්ත මන්ත්‍රීතුමා කියපු කරුණුවලට අපි හොඳට සවන් දුන්නා. අන්න ඒ වගේ අදහස් තමයි අපට ඕන. අපි මෙතනට ආවේ වැඩ කරන්න. වැඩ කරන ජනතාවක් වශයෙන් අපේ සියලු දෙනාටම සහයෝගය ලබා දෙන්න කියලා තමයි සභාපතිතුමා ගෙන් ඉල්ලුවේ. අපිත් එතුමාගෙන් ඒ ආකාරයෙන්ම ඉල්ලනවා. අපට හැකි ප්‍රමාණයෙන් කොහොම හරි අපිත් මුදල් හොයලා දෙන්නම්.

ඒ වගේම කටුපොල් සම්බන්ධව විශේෂ කාරණයක් මට කියන්න තියෙනවා. ඊයේ දවසේ නලින් හේවගේ මන්ත්‍රීතුමාත් සම්බන්ධවෙලා යටලමත්ත ප්‍රදේශයේ දේශනයක් පැවැත්වූවා. එහිදී, එකොළොස් වැනිදා ලොකු උද්ඝෝෂණයක් කරලා, ඒ සම්බන්ධව දැනුවත් කරලා, මේ මහා වියසනයෙන් අපි ගැලවෙන්න, අපේ දරුවන් ගලවාගන්න, පක්ෂ පාට භේදයක් නැතුව සියලුදෙනාටම එදාට පැමිණෙන්න කියලා මම ආරාධනා කරනවා. අපි අපේ බලවේගය පෙන්වමු. කටුපොල් හිටවන්න කියලා පාර්ලිමේන්තුවේ කොහේවත් සම්මත වෙලා නැහැ. පරිසරවේදීන් පවා කටුපොල් හිටවන්න එපා කියලා තමයි කියලා තියෙන්නේ. මේ ව්‍යාපාරය නාකියදෙණියෙන් තමයි පටන් ගත්තේ. ඒ නිසා මෙය නැවැත්වීමට අපි සියලූදෙනා එකට එකතු වෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම අපේ කුඹුරුහේන කණිෂ්ඨ විද්‍යාලයට වීථි ලාම්පුවක් දාල දෙන්න කියලා ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, අර බදු අයකිරීම් අය කර ගමු. උඩුගම පොළේ බදු වලට පොලීසියෙවත් තාම පැමිණිල්ලක් දාලා නැහැ. අපිට ඒ ගැන කිසිම විස්තරයක් දුන්නේ නැහැ. අපි අහන්නේ පොලිසියෙ පැමිණිල්ලක් දැම්මද? මොකද එකපාරටම නඩුවකට යන්න බැහැ. ඒ නිසා ඒ සම්බන්ධව අපට කියන්න.

එමෙන්ම අද මෙම සභාවේ ලැබීම් හා ගෙවීම් වාර්තාව කියවුණේ නැහැ. න්‍යාය පත්‍රයේ නම් තිබුණා. ඒ වගේම ගරු සභාපතිතුමනි, මාපලගම බස් නැවතුම්පොලේ පොදු වැසිකිලිය අනිවාර්යෙන්ම හදන්න ඕන කියලා මම යෝජනා කරනවා. පියල් මන්ත්‍රීතුමා, ගයාන් මන්ත්‍රීතුමා, ගනේවත්ත මන්ත්‍රීතුමා සියලුම දෙනා මේ සම්බන්ධව ඒකමතිකව ඉන්නවා. මේ අත්සන් ලේඛනය බොරුවක්. එතන ඉන්න කොන්දොස්තරලා නෙවෙයි මේ අත්සන් කරලා තියෙන්නේ. අපි මේ අත්සන් ලේඛනය කොපි ගහලා එතන ප්‍රදර්ශනය කරන්න ඕන. අපේ තීරණයෙ අපි එකහෙළාම ඉන්න ඕන. ඒ වගේම ගරු සභාපතිතුමනි, මාපලගම ආයුර්වේදයේ වෙද නලාව ගෙනැල්ලා දුන්නද දන්නේ නැහැ. අපට ඒ ටික කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

එමෙන්ම අපේ කටුපොල් විරෝධී උද්ඝෝෂණයට පරිසර නිලධාරී අනිවාර්යයෙන්ම සහභාගි කරවන්න. එතකොට අපට ඒ අයට උත්තර දෙන්න පුළුවන්. මේ ප්‍රශ්නය හැමතැනින්ම නවත්තන්න කියනවා. කිසිම කෙනෙක් නවත්තන්නෙ නැති නිසා අපි සියලු දෙනාම එකතුවෙලා එකොළොස් වෙනිදට යටලමත්තට රැස් වෙමු. අපි මිනිස්සු සමග ඉඳිමු. උදේ නමයට තමයි මේ උද්ඝෝෂණය කරන්නේ. කටුපොල් වගාව හා ඒ ආශ්‍රිත සියලු දේ නවත්වන්න කියලා තමයි මේ උද්ඝෝෂණය කරන්නේ. මේක දේශපාලන රාමුවකින් නොබලා සියළුදෙනා වෙනුවෙන් තමයි කතා කරන්නේ. ඒ නිසා සියලුම මන්ත්‍රීවරුන් මේ සඳහා සහභාගි වෙන්න කියලා ආරාධනා කරමින්, ලැබුවාවූ නව වසර සතුට, සෞභාග්‍ය පිරි සියලුදෙනාටම කරන, කියන කටයුතු ඉෂ්ඨ වේවා යි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

## ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා

ගරු සභාපතිතුමා අවසරයි. මම මීට කලින් සභාවාරයක ප්‍රකාශ කළා කටු පොල් වතු ආශ්‍රිතව කටුපොල් අපද්‍රව්‍ය ගොම සමග කලවම් කරලා කොම්පෝස්ට් කියලා ගෙනැල්ලා දානවා. ඒ සම්බන්ධව සභාවෙන් ලිඛිතව දන්වනවා කිව්වත්, මේ වන තෙක් ලිඛිත දැන්වීමක් ලැබුණේ නැහැ. මටත් ලිපියක් ලැබෙනවා කිව්වා. නමුත් තවම නැහැ. නමුත් ඒ කටයුත්ත දැනටත් සිදු වෙනවා. කටුපොල් අපද්‍රව්‍ය ගොමත් එක්ක කවලම් කරලා තමයි ගිහින් දාන්නෙ. ඒ කොට්ඨාශය නියෝජනය කරන්නේ මම නිසා මිනිස්සු කරන ඉල්ලීමක්, චෝදනාවක් නිසයි මම ඒ සම්බන්ධව දැනුවත් කළේ. නමුත් p.h.i. මහත්තයා ගිහිල්ලා හෝ එහෙම වාර්තාවක් තවම ලැබිලත් නැහැ. ඒ වගේම තව දෙයක් කටුපොල් වගාව සම්බන්ධව කතා කිරීමේදී, ජාතික ආර්ථික සභාව රටේ කැබිනට් තීරණය හා සමානයි. ඔය ජාතික ආර්ථික සභාවෙ තීරණය ක්‍රියාත්මක කරන්න බැහැ කියලා කියන්න බැහැ. මේ ගොල්ලෝ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවෙ තීරණය ක්‍රියාත්මක කරන්න බැහැ කියන්නෙ කැබිනට් මණ්ඩලයෙන් ගත්ත තීරණය අභිබවා යන්න බැහැ කියන තර්කයේ ඉඳගෙන. මේ ජාතික ආර්ථික සභාවෙ තීරණය ක්‍රියාත්මක කිරීමේදී පළාත් පාලන ආයතනවලට සහ අනිකුත් ආයතනවලට තියෙන බලතල ක්‍රියාත්මක වෙන්නේ කොහොමද? ගලාගෙන යන්නේ කොහොමද? කියලා මම දැනුවත් නැහැ. මේ සම්බන්ධව ප්‍රාදේශීය සභාවේ අපට යම්කිසි දෙයක් කරන්න තියෙනවද කියලා සොයා බලන්න කියලා මම ගරු සභාපතිතුමා ගෙන් ඉල්ලා සිටිනවා. එතකොට ඒ හරහා මේ කටුපොල් වගාව නවත්වන්න පුලුවන්. මොකද දැන් අද සිදුවුන වියසනය වෙනම එකක්. ඒක මීට කලිනුත් සඳහන් කළා. මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය, ප්‍රමිති සහතිකය නැතිව තමයි කටුපොල් කර්මාන්තශාලාව පවත්වා ගෙන යන්නේ. කටුපොල් කර්මාන්තශාලාව ආශ්‍රිතව තියෙන ගැටළු සම්බන්ධව මීට වැඩි අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඒ වගේම තව දෙයක් ඔබතුමාට මතක් කර සිටින්න ඕන. තල්ගස්වල ප්‍රදේශයේ නව කටුපොල් කර්මාන්තශාලාවක් ඉදි කිරීමේ සූදානමක් තියෙන බව දැනගන්න ලැබිලා තියෙනවා. මේ වෙද්දි භූමිය සකස් කිරීම් කටයුතු සිදුවෙනවා. නාකියාදෙණියෙන් සිදුවන පරිසර විනාශය වගේ පරිසර විනාශයක් සිදු වුනොතින් තල්ගස්වල ප්‍රදේශය නාගොඩ ප්‍රාදේශීය සභාවේ ලොකු ගැටලුවක් බවට පත්වෙන්න ඉඩ තියෙනවා. මේ ප්‍රදේශයේ ජනතාවගේ විශේෂයෙන් ගත්තම දැනට නාකියාදෙණිය කටුපොල් කර්මාන්තශාලාවේ ඒ ගොල්ලන්ගේ ලිමිට් එක පන්නලා තියෙනවා. ඒ කියන්නේ ඒ කර්මාන්තශාලාවේ තියෙන වපසරිය තියෙන කටුපොල් ප්‍රමාණයට වැඩිය අඩුයි. ඒකෙ ප්‍රතිඵලයක් විදිහට තමයි මේගොල්ලෝ තල්ගස්වල ප්‍රදේශය ශුද්ධ කිරීමේ කටයුතු කරනවා කියලා කියන්නේ. එහෙම වුණොත් ඒක දැඩි ගැටලුවක් වෙනවා. මේ සම්බන්ධව ප්‍රාදේශීය සභාව අවධානය යොමු කරන්න කියලා මම මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා.

## ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. දැන් ඔය කටුපොල් වගාව නවත්තනවයි කිව්වට තවම වවනවා. මම ඊයේ ඒ ගැන බලන්න කන්දෙ ගියා. දැන් ඒ ගොල්ලෝ ක්‍රමානුකූලව පැල හිටවන්නේ නැහැ. ප්ලැට් ෆෝම් කපන්නේ නැහැ. පැළය අරගෙන ගිහිල්ලා රෑට හිටවනවලු. ඉතිං අපි කොච්චර මෙතන කතා කළත් එයාලා පැල ටික ඉන්දනවා. මම ඊයේ යනකොට කුඤ්ඤ ගහලා තිබුණා. හෙට අනිද්දා වෙනකොට පැල ටික ඉන්දාවි. ඒ නිසා අපි කොහොම හරි, බලහත්කාරයෙන් හරි ඒ පැළ ටික ගලවල දාන්න ඕන. ඊයේ අපට තවත් පිරිසක් එකතු වුණා. පොලිසියට දැනුම් දීලා තමයි ඒ වැඩසටහන කරන්නේ. ඔබතුමාලත් එන්න. අපි හිතනවා කටු පොල් තහනම් කර ගත්තොත් හොඳයි කියලා. අපේ නන්දන මන්ත්‍රීතුමා කිව්වා දහතුන්වැනිදා අපේ පාලම් මුල්ගල් තියෙනවයි කියලා. අපට ඒ සඳහා සහභාගි වෙන්න පුළුවන් වෙයිද දන්නෙ නැහැ. පුහුණු වැඩසටහනක් තියෙන්නෙත් එදාට.

කොහොම හරි එනවා. අපේ ගමේ වැඩක් නිසා සහයෝගය දෙන්න ඕන. ඒක නිසා සියලු දෙනා මුල්ගල් තියෙන එකටත් එන්න. එකොළොස් වෙනිදා උදේ නමයට යටලමත්ත හන්දියට එන්න. ඇවිල්ලා පොඩ්ඩක් දැනුවත් කරලා මොනවා හරි වැඩපිළිවෙලකට යමු. ඒ වගේම නාකියාදෙණිය මාමණඩොලේ ඇලේ ජලයට මොනවද දාලා කිව්වා. අපි මේ සභාව ඉවරවෙලා එතනටත් පොඩ්ඩක් ගියොත් හොඳයි කියලා හිතනවා.

**ගරු මන්ත්‍රිණී කේ. කේ. අයි. නෙරංජලී මහත්මිය**

ගරු සභාපතිතුමාගෙන් ද, ලේකම්තුමියගෙන් ද, සියලුම මන්ත්‍රීවරුන්ගෙන් ද, මන්ත්‍රීවරියන්ගෙන් ද අවසරයි. ප්‍රථමයෙන්ම ලැබූ නව වසර සුබ නව වසරක් වෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා. ඒවගේම නන්දන මන්ත්‍රීතුමා කිව් පරිදි අපේ ප්‍රදේශයටත් එක පාලමක් ලැබිලා තියෙනවා. ඒ ගැන අපේ සතුට ප්‍රකාශ කරනවා. අනෙක් කරුණ තමයි උඩවැලිවිටිය ප්‍රජාශාලාවෙ මේ වන විටත් විදුලිය කපලා මාස දෙකක් විතර වෙනවා. එහෙත් කියන්නේ ප්‍රාදේශීය සභාවට අයිති එකක් කියලා. ඒ ගැන ඔබතුමා කුමක් හෝ පියවරක් ගන්න කියලා ඉල්ලා සිටිනවා.

අනිත් කරුණ තමයි උඩවැලිවිටිය ඉදුරුකුඹුර මාර්ගය මේ වන විට පාර අයිනේ යම්කිසි නිවසකින් කඩ කාමරයක් හදල තියෙනවා. ඒ ගැන කිහිප දෙනෙක් මට පැමිණිලි කළා. ඒ ගැන මම ඔබතුමාට දුරකථනය මගින් දැනුම් දුන්නා. කොන්ක්‍රීට් පාර අයිනට වෙන්න තමයි හදලා තියෙන්නේ. ලක්රුවන් මන්ත්‍රීතුමා ඒ පිළිබඳව දන්නවා ඇති. මේ පිළිබඳව මුලින්ම සොයා බලන්න ඕන. මොකද නැත්නම් ඔවුන්ගෙන් ලිඛිතව හරි ලිපියක් ගන්න ඕන. පාර යම් කලකදී පුළුල් වෙනකොටත්, අලාභ නොඉල්ලා ඒ කටයුතු කරගන්නා ලෙසට ඉල්ලීමක් ගන්න ඕන. අනිත් එක තමයි මම කිහිප අවස්ථාවකදීම සඳහන් කළ පරිදි අපේ ප්‍රදේශය මාන පඳුරු වලින් මේ වන විටත් වැසියාමක් පවතිනවා. පාර දෙපැත්ත සුද්ද කර දෙන මෙන් ඉල්ලා සිටිමින්, මගේ කතාව අවසන් කරනවා.

**ගරු මන්ත්‍රිණී අරුණ ශාන්ති මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. පළමුවෙන්ම මම ලැබුවාවූ නව වසර සුභ නව වසරක් වේවා කියලා ගරු සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රී මණ්ඩලයට ලේකම්තුමියට, නිලධාරී තුමන්ට ප්‍රාර්ථනා කරනවා. ඉතින් අද කාල වේලාව නො ඉක්මවා සභාව අවසන් කළ යුතු බැවින්, මමත් කෙටියෙන් සභාපතිතුමාගෙන් දෙයක් අහන්න කැමතියි. දැන් නව වර්ෂයේ පොළවල් බදු දීම සිදු කළා. තල්ගස්වල පොලේ පසුගිය කාලයේ මස් කඩයකට වෙන් කරලා තිබුන 224 වෙනි කඩ කාමරය බදු කරුට එයත් සමග බදු දෙනවද? එහෙම නැත්නම් ඒ කඩ කාමරයට බදු ගෙවනවා ද? නැද්ද? දැන් බදු ගත්තු කෙනා ඒ කඩ කාමරය නැතුවද බදු ගෙවන්නේ කියන එක දැනගන්න ඕන. වෙනත් දෙයකට ඒ කඩ කැල්ල ලබාදෙන්න ඉල්ලීම් කරලා තියෙනවා. ඒක නිසා ඒක දෙන්නේ නැහැයි කියලා තමයි කියන්නෙ. ඒ කඩ කැල්ල, මාළු හරි මොනව හරි දාන්න ඉල්ලීම් කරලා තියෙනවා. මම අහන්නේ, දැන් පොල බදු ගනිපු කෙනා ඒ කඩ කැල්ල නැතුවද අනෙක් සියලුම දේ බදු දීලා තියෙන්නේ කියලා. ඒ කඩ කැල්ල දැන් තියෙන්නෙ නිකන් ලූ . ඒකට බදු ගෙවනවා කියලා ඒකට බඩු දාන්න එපා කියනවලු. ඒක නිසා මම අහන්නේ ඒකත් එක්ක ද බදු දීලා තියෙන්නෙ කියලා. ඒ කාරණය පිළිබඳව මම දැන ගන්න කැමතියි. ඒ වගේම පොලේ නව සංවර්ධනයක් වෙමින් පැවතිලා තියෙනවා. ඒත් සභාපතිතුමා, කිසිදු පිරිසුදු කිරීමක් නම් සිදුවෙලා නැහැ. එදා නම් කිව්වේ පිරිසිදුකිරීම් පොළ බදු ගනිපු අයට පවරල තියෙනවා කියලා. ඉතින් මම කියන්නේ දැනුවත් කරලා, පිරිසිදු කිරීම් කරනවා නම් ගොඩක් හොඳයි. ඒ නිසා එම බදු කරුට පොළ පිරිසිදු කරන්න කියලා ඔබතුමා ඔහුව දැනුවත් කරනවා නම් හොඳයි කියලා මම හිතනවා. ඒ ගැනත් මතක් කරනවා. ස්තුතියි.

**ගරු උප සභාපතිතුමා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, දකුණු පළාතේ ප්‍රධාන දේශපාලන නායකයෙකුට පළාත් පාලන විෂය පිළිබඳව ඇමති තනතුරු ලබා දීම පිළිබඳව මුලින්ම අපි ස්තුතිවන්ත වෙනවා. දේශපාලනයකින් තොරව අපි බලාපොරොත්තු වෙනවා. වජිර අබේවර්ධන මැතිතුමා, විශේෂයෙන්ම ගාල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතනවලට වෙනත් දිස්ත්‍රික්කවලට වඩා එතුමාගේ බැල්ම, ශක්තිය ලබා දීලා කටයුතු කරයි කියලා. අපේ නිශාන්ත මන්ත්‍රීතුමා මේ අවස්ථාවේදී ඉඟියක් ලබා දුන්නා. දැනටමත් අපේ ප්‍රදේශයේ ළමා උයන් කිහිපයකට ආධාර උපකාර කරන්න එතුමා යෝජනා කරන බව. ඒ වගේම උඩලමත්ත මීපේ ගෙදර පාලම ඉදිකිරීම පිළිබඳව එතුමා සිහිපත් කළා. ලබන 13 වැනිදා ඒ සඳහා මුල්ගල තියනවා. ඒ සඳහා සම්බන්ධ වෙන්න කියලා ප්‍රකාශ කළා. ඒ පිළිබඳවත් අපි ස්තුතිවන්ත වෙනවා. මේ මීපේ ගෙදර පාලම මෙතනට ආවේ ගියේ කොහොම ද යන්න පිළිබඳව මම දිගට කතා කරන්න යන්නේ නැහැ. මේක කාලයක් තිස්සේ පාලම් දාහේ ව්‍යාපෘතිය යටතේ සැලසුම් කරලා, යෝජනා කරලා, නිර්මාණය වෙච්ච පාලමක්. පාලම ඉදි කරල තිබුනෙ. මීපේ ගෙදර පාලම මහ ගංවතුරට ගියා. මේ පාලම ගියෙත් නාකියාදෙණිය වතුයායෙ කටු පොල් ගස්වලට හිරවෙලා. ඊට පසු වසර කීපයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා, මහ ගංවතුරත් එක්ක ආපු ව්‍යාපෘති වලට නම් කරලා, යෝජනා කරලා, සමීක්ෂණය කරලා, ඉල්ලීම් කරලා පාලම ලබාගැනීමට අපි දීර්ඝ වශයෙන් කටයුතු කළා. අපේ පළාත් පාලන ඇමති වජිර අබේවර්ධන මැතිතුමා මේකෙ මුල් ගල් තියන එක ගැන ප්‍රශංසා කරන ගමන්ම, මේ සඳහා ආරම්භයේ දී දායකත්වය ලබා දුන්න ගරු අමාත්‍ය යූ.ජී.ඩී ආරියතිලක මැතිතුමා, හිටපු අමාත්‍ය නිශාන්ත මුතුහෙට්ටිගම පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාටත් මේ අවස්ථාවේදී ප්‍රශංසාව හිමි වෙන්න ඕන.

ඒ වගේම පාලමක් ගමට ගෙන ඒම එකරැයෙන්, එක දවසින් කරන්න පුළුවන් කාර්යයක් නෙවෙයි. දීර්ඝ කාලයක් යෝජනා කරලා, අදහස් කරලා අවශ්‍ය කටයුතු කරන්න ඕන. ඒ සඳහා දීර්ඝ කාලයක් යනවා. මෙහිදී මමත් මේ කාරණයට යම් දායකත්වයක් ලබා දුන්නා. ගමේ දේශපාලන නායකත්වය වශයෙන් මම තමයි ඒ පාලම ඉදිකරන්න ඇලෙන් එගොඩ තියෙන බිම් කට්ටි කරුවන්ගෙන් කැමැත්ත ලබා ගන්න කටයුතු කළේ. ග්‍රාම නිලධාරී කාර්යාලයට ගෙන්නලා කැමැත්ත ප්‍රකාශ කිරීමේ ලිපිය හම්බන්තොටින් ආපු ප්‍රොජෙක්ට් එකේ අයට ඉල්ලපු නිසා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්තුමා ඉදිරියේ අත්සන් ලබා දීලා, ඒ කටයුතු කළෙත් මම. ඒ හැම අවස්ථාවකදිම ගරු අමාත්‍ය නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමා, යූ.ජී.ඩී ආරියතිලක මැතිතුමා දායකත්වය ලබා දුන්නා. නිශාන්ත නන්දන මන්ත්‍රීතුමා ඇතුළු ඒ දේශපාලන අධිකාරියේ නායකත්වයත් මේකට අනුකූල වෙලා ඒ කටයුත්ත කිරීම පිළිබඳව ගම්වාසීන්ගේ, ප්‍රදේශවාසීන්ගේ සුභපැතුම් මේ අවස්ථාවේදී එකතු කරන්න කැමතියි.

ඊළඟට අපේ ජනතා විමුක්ති පෙරමුණේ සහෝදර මන්ත්‍රීතුමා දහතුන්වෙනිදා කටු පොල් විරෝධතාවය සඳහා පැමිණෙන ලෙස ආරාධනා කළා. මේ කටුපොල් වගාව පිළිබඳව තීරණයක් ලබාදිය යුත්තේ මධ්‍යම පරිසර අධිකාරියෙන් තව දුරටත් මේ අපේ භූමිය තුළ කටුපොල් නැවත වගාව සිදු නොකරන්න තීන්දුවක් අරගෙන තියෙනවා. ඒ වගේම අද මේ ප්‍රදේශයට සිදු කරපු මහා ව්‍යසනය නිසා, නාකියාදෙණිය කටුපොල් කර්මාන්තශාලාවේ බලපත්‍රය තාවකාලිකව නතර කරලා තියෙන්නේ. ගරු සභාපතිතුමනි, බලපත්‍ර දීලා නැහැ යම් යම් හේතූන් උඩ. ඒ වගේම ඒ අයට අධිකරණයෙන් ලබා දීපු උපදෙස් අනුව ඒ පිරිපහදුවෙ යම් යම් දෝෂ තියෙනවා. ඒ පිරිපහදුවේ යම් රසායන ද්‍රව්‍ය පිරිසිදු කිරීමේදී ඒ ආයතනයට වටවල වැව්ලි සමාගමට ඒ කටයුත්ත කරගන්න බැරි තත්ත්වයට පත් වෙලා තියෙනවා. ඒ නිසා ඒකටත් ඒ අය කල් ඉල්ලලා තමයි ඒ පිරිපහදුවත් පවත්වාගෙන යන්නේ. කොහොම නමුත් අද වෙච්ච වියසනය මමත් තරංග මන්ත්‍රීතුමාත් අපි කිහිප දෙනෙක් සම්බන්ධ වුණා. අපි දැක්කා. ඔබතුමාලත් ගිහිල්ලා බලන්න. මේ හානිය වළක්වා ගන්න

දැන් සැහෙන උත්සාහයක් ගන්නවා. ඒ නිසා අපි තමුන්නාන්සේලාටත් ආරාධනා කරනවා මේ සභාවේ ඉවරවෙලා ගිහිල්ලා බලන්න කියලා. එකක් සිහිපත් කරමින් කවුරු කරා වුනත්, කවුරු ආරම්භ කළා වුණත්, නිශාන්ත නන්දන මන්ත්‍රීතුමා කිව්වා වගේ මේ පිළිබඳ අපට ආරාධනා කලාට, පුද්ගලිකව මේ උත්සවයට සම්බන්ධ වෙන්න මමත් කැමතියි. නමුත් අපේ දේශපාලන අධිකාරියේ නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමා හා ඒ සඳහා සහයෝගය දැක්වූ ආරියතිලක මැතිතුමාටත් ආරාධනා කරනවා නම් පමණක් අපි සම්බන්ධ වෙන්න කැමති බවත් ප්‍රකාශ කරනවා. කොහොම නමුත් අපේ ප්‍රදේශයට මේක ලක්ෂ 300ක 400ක පාලමක්. එක ආරම්භ කරන්න, අපේ ගමේ ගම්වාසීන්ට එගොඩ මෙගොඩ යන්න කටයුතු සැලසීම පිළිබඳවත් ස්තුතිවන්ත වෙමින්, ඒ වගේම දන්නා, කියන යමක් කළ හැකි වජිර අබේවර්ධන මැතිතුමාට පළාත් පාලන විෂය ලබාදෙමින් අපේ ආයතන නගා සිටුවීමට කටයුතු කිරීමට එතුමාට ශක්තිය, ධෛර්යය ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

### ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි මේ වෙලාවේ දීර්ඝ වශයෙන් කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මොකද මහජන සුබ සිද්ධිය උදෙසා තව මොහොතකින් අපි නාකියාදෙණිය ප්‍රදේශයට යා යුතුයි. ඒ නිසා මම කෙටියෙන් කතා කරනවා. ගරු නිශාන්ත මන්ත්‍රීතුමා කියපු විදිහට දීර්ඝ කාලයක් යටපත්වෙලා තිබුණු ප්‍රදේශයට අත්‍යවශ්‍ය කරන ඒ පාලම්, බෝක්කු ටික ක්ෂණිකව පළාත් සභා හා පලාත් පාලන ඇමැතිවරය හැටියට ගාල්ල දිස්ත්‍රික් නායක වජිර අබේවර්ධන මැතිතුමා පත් වුන නිසා ඇතිවුණ ප්‍රතිඵලයක් හැටියට පෙන්වා දෙන්න පුළුවන්. අපි දිනුම් කියන පණිවිඩය මේ වෙලාවේ මට කියන්න පුළුවන්. මේ පාලම්, බෝක්කු සඳහා සැලසුම් හදන්න ඇති. අපි ඒවා ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. සැලසුම් හැදුවට ක්‍රියාත්මක වෙන්නේ නැ.හැ මුල්ගල් තිබ්බට ක්‍රියාත්මක වෙන්නේ නැහැ. එවැනි දේශපාලන පසුබිමක් තියෙන රටක අපේ නායකතුමා පත් වීමේ ප්‍රතිඵලයක් ලෙස මේ කාර්‍යයන් කර ගැනීමට හැකියාව ලැබෙනවා. මේ පාලම් වලින් වැඩි හරියක් හිනිදුම ආසනේ ආවරණය වෙනවා. ක්ෂණිකව සති ගාණක් යන්න ඉස්සරවෙලා ක්‍රියාත්මක වෙමින්, තව සතියකින් මුල්ගල් තියලා දෙසැම්බර් 31ට පෙර අවසන් කරන්න හදන කටයුත්තක් හැටියට දකින්න පුලුවන්. මෙය අපි ලැබූ ජයග්‍රහණයක් කියල අපිට සතුටු වෙන්න පුළුවන්. ඒ නිසා නාගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ඇතුළු පක්ෂ, විපක්ෂ සියලු දෙනාගේම ගෞරවය පළාත් පාලන අමාත්‍යවරයාට මම මේ වෙලාවෙදි පුද කරනවා. මම හිතනවා සිදුවෙන්න ඕන ඒකයි. මොකද මම ඊයේ මාධ්‍ය දිහා බලනකොට බෙලිඅත්ත මාතර දුම්රිය මාර්ගය සකස් කරල, ඒක විවෘත කරන්න කටයුතු කරන අවස්ථාවේ රේල් පාරවල් වල නිදා ගන්න මිනිස්සු දැක්කා. එවැනි සමාජයක් තමයි දැන් තියෙන්නෙ. ඒ කොහොම වුනත් අපි ගෙවන බද්දෙන් තමයි රටේ සංවර්ධනය සිද්ධ වෙන්නේ. ඒක නිසා එවැනි අවස්ථාවකදි එය කඩාකප්පල් නොකර සිදුකරන්න ඉඩ දෙනවා නම් ගොඩක් හොඳයි කියලා මම හිතනවා. අපේ ගරු සභාපතිතුමා අවුරුදු 4කට අපි ඇවිල්ල ඉන්නේ. තව අවුරුදු 4කින් ඔබතුමා වෙනස් වෙන්න පුළුවන්. එහෙමනම් පත්වෙන කවර සභාපතිවරයා වුවද එතුමා ගෙන ආ ඒ කටයුත්ත අවසානය දක්වා ගෙන යා යුතුයි. ඒක තමයි සභාවකත්, රාජ්‍ය පාලනයෙත්, මේ අපි සියලු දෙනාගේ ම මහජන නියෝජිතයෝ හැටියට වගකීම වෙලා තියෙන්නේ. ඒ ගැන අපි ආඩම්බර වෙන්න ඕන. ඒ නිසා මේ වෙලාවේ රටට අවශ්‍ය කරන දේ, ප්‍රදේශයට අවශ්‍ය කරන දේ සිදුවෙනවා නම්, අපි සියලු දෙනාම පක්ෂ පාට භේදයකින් තොරව අපේ ගමේ සංවර්ධනයට, යටිතල පහසුකම් සංවර්ධනයට, අහිංසක ජනතාවට සේවයක් වනවා නම් ඒ ගැන අපි සතුටු විය යුතුයි. ඒ වගේම මම අපේ ගරු සභාපතිතුමාට මගේ ගෞරවයක් පුද කරන්න තියෙනවා. මොකද පසුගිය දවස් වල අපේ පාර සුද්ද කරන්න එතුමා මැදිහත් වෙලා කටයුතු කළා. මොකද වෙනදනම් කොමසාරිස්තුමිය ළඟට ගිහිල්ලා එතුමියගෙන් අවසර අරගෙන තමයි පාර සුද්ද කරන්න හැකියාව ලැබුණේ. මම මේ

අවස්ථාව හිටපු සභාපතිවරයෙක් හැටියට මේ ආයතනයෙන් කීප අවස්ථාවක ඉල්ලුම් කලත්, ඒ කටයුත්ත සිදු වුණේ නැහැ. ඒ වගේම අජිත් එඩේරආරච්චි මන්ත්‍රීතුමා සභාපතිධූරය දරද්දී හා විලේගේ ගරු සභාපතිතුමා සභාපතිධූරය දරද්දී ඒ කටයුත්ත සිදු කළා. නමුත් මේ කිසිවෙක් මහජන නියෝජිතයෝ නැති වෙලාවල් වල අපට මේ කටයුත්ත කරලා දෙන කිච්චහම අන්තිමට නතරවෙන්න සිද්ධ වුණේ කොමසාරිස්තුමිය ලඟ. ඒ නිසා අපේ ප්‍රදේශයේ උත්සව අවස්ථාවක් සඳහා පාර සුද්ද කරල දෙන්න කියල ගරු සභාපතිතුමාට ලබාදුන් දූරකථන ඇමතුමට ඇහුම්කන් දීලා එතුමා ඒ කටයුත්ත ඉටු කළා. හැබැයි තව පොඩ්ඩක් තියෙනවා තව දවසක් ගියා නං වැඩේ සම්පූර්ණයෙන්ම ඉවරයි. නමුත් අවශ්‍ය තැනට කටයුත්ත අවසන් කළා. නැවතත් ඒ වෙනුවෙන් මම මගේ ගෞරවය ඔබතුමාට පුද කරනවා. මගේ කතාව තව දීර්ඝ කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. අපි සියලු දෙනාම අද හොඳ දෙයක් කළොත්, හොඳ දේ දකිනවා. නරක දෙයක් කරොත්, නරක දේ දකිනවා. හොද දෙයක් කරොත්, පවතිනවා. නරක දෙයක් කරොත්, ඒක විනාශ වෙනවා.

ඒ වගේම මම තවත් ඉල්ලීමක් කරනවා. මේ යෝජනාව කලින් අපේ උපසභාපති ගාමිණී සුසන්ත මහතාටත් ඇවිල්ල තියෙනවා. ඊට පස්සෙ තමයි මට ආවෙ. නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ උඩලමත්ත බීරිගෙවත්ත මාර්ගය නාගොඩ ප්‍රාදේශීය සභාවට පවරා ගන්නා ලෙස ඉල්ලීමක් කරලා තියෙනවා. මෙහි මිනිසුන් 148 දෙනෙක් අත්සන් කරලා තියෙනවා. හිටපු ගරු ඇමතිතුමා නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමාගෙ ප්‍රතිපාදනවලින් මේ සඳහා ප්‍රතිපාදන මීට කළින් වෙන්කරලා තියෙනවා. රජයෙන් බෝක්කුවක් දාලා තියෙනවා, කොරිපස් දාලා තියෙනවා. මේ මාර්ගය පවරා ගැනීමේ ගැටළුවක් නැහැ. මිනිස්සු 300- 400 ක් යන මාර්ගයක් නිසා ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමේ කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.දැන්ම පටන් ගත්තොත් තව අවුරුද්දකින්වත් ඉවර කර ගන්න පුලුවන් වෙයි. ඒ නිසා මේ මාර්ගයේ දැනට භාවිතා කරන ප්‍රමාණය හෝ ප්‍රාදේශීය සභාවට පවරා ගන්න කියලා යෝජනා කරනවා.

ඒ වගේම නැවත වතාවක් ගාල්ල දිස්ත්‍රික් නායක පලාත් පාලන අමාත්‍ය වජිර අබේවර්ධන මැතිතුමාට අප ප්‍රදේශයේ සියලුම සංවර්ධන කටයුතුවලට දායකත්වය ලබාදී දී නාගොඩ ප්‍රදේශයේ සංවර්ධනය ඉතාමත් ඉහළ මට්ටමින් වර්ධනය කරගැනීමට හැකියාව ලැබේවායි ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම ලැබුවා වූ 2019 වර්ෂය සියලු බලාපොරොත්තු ඉටුවන සුභ නව වසරකට ප්‍රාර්ථනා කරමින්, මා නිහඬ වෙනවා.

### ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා

ගරු සභාපතිතුමනි, මේ වෙලාවේ සියලුදෙනාටම සුභ අලුත් අවුරුද්දක් ප්‍රාර්ථනා කරමින් අපේ ඉනෝකා මන්ත්‍රීතුමිය සඳහන් කළ පරිදි උඩවැලිවිටිය අපේ ප්‍රජාශාලාව සම්බන්ධයෙන් අපි පහුගිය සභාවාරයේදී කතා කළා. ප්‍රජාශාලාවේ අයිතිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් පූර්ණ වශයෙන් සභාවට පවරලා තියෙන්නේ. ඒ සඳහා හිඟ බිල්පත් ගෙවීම සඳහා ගමේ ස්වෙච්ඡා සමිති කිහිපයක් සූදානමින් ඉන්නවා. ඒ නිසා එහි අයිතිය සඳහන් කරලා ඔබතුමා ලිපියක් ලබා දෙන්න. විදුලිබිල සභාව නමට ලබාගැනීම සඳහා ලිපියක් ලබා දෙන්න කියලා ඉල්ලීම් කරනවා. සමහරවිට අද දිනයේදී සමෘද්ධි සංවර්ධන නිලධාරී තුමා මේ ස්ථානයට පැමිණේවි. ඒ නිසා ඒ අවශ්‍ය පහසුකම් සලසා දෙන්න. ඒ වගේම ඒ ප්‍රජාශාලාව වටේ කැලේ වැවිලා. එය ඉක්මනින් ශුද්ද පවිත්‍ර කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සපයා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම මම සතුටුවෙනවා. උඩවැලිවිටිය කොට්ඨාශය සහ ගම්මැද්දේගොඩ යා කරන මාර්ගයේ පාලමක් ඉදිකිරීම සම්බන්ධයෙන්. ඒ මාර්ගයට 2004 වර්ෂයේ සිට මේ දක්වා උසාවියේ නඩුවක් පවතිනවා. ඒ සඳහා මගේ පෞද්ගලික මුදල් වියදම් කරමින් මම නොකඩවා ඉදිරිපත් වෙනවා. එම මාර්ගයේ ගමන් කරන ප්‍රදේශවාසීන් සහ අපේ ගරු මන්ත්‍රීතුමිය මේ පිළිබඳව පොඩි අවධානයක්

යොමු කරලා මේ උසාවියෙ තියෙන නඩුව නිරාකරණය කර ගැනීම සඳහා කටයුතු කරනවා නම් හොඳයි. මම හිතන්නේ දැනට ලක්ෂ දහයකට කිට්ටු වෙන මුදලක් මේ වෙනුවෙන් මම පෞද්ගලිකව වියදම් කරලා තියනවා. ඒ සියලු බිල්පත්, නීතිඥ ගාස්තු ලිපි ලේඛන මම ළඟ තියෙනවා. නඩුව දාලා තියෙන්නේ මගේ නමට. නඩුව දාලා තියෙන්නේ මාර්ගය කැපීම සම්බන්ධයෙන් නෙවෙයි. පාර කැපුවේ 2001 වර්ෂයේ නිශාන්ත මුතුහෙට්ටිගම නියෝජ්‍ය ඇමතිතුමා සභාපතිතුමා වෙලා ඉන්න කාලේ. ඒ අවස්ථාවේදී මාර්ගය කොන්ක්‍රීට් කරන්ත් මූලිකත්වය ගත්තේ මම. මාර්ගය කපන අවස්ථාවේදී ඒකට කිසිම කෙනෙක් ඉදිරිපත් වුණේ නැහැ. කොන්ක්‍රීට් කළාට පස්සෙ තමයි පෞද්ගලිකව මා ඇතුළු කිහිපදෙනෙකුට ඒ නඩුව ඉදිරිපත් කරලා තියෙන්නේ. ඒ සඳහා අපේ මන්ත්‍රීතුමිය, ඔබේ ගමේ ස්වෙච්ඡා සංවිධාන සමඟ සාකච්ඡා කරලා, මේ සඳහා මැදිහත්වීමක් කර අදාළ පාර්ශවයන් සමග සාකච්ඡා කළොත් ඉතාම හොඳයි. මම ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කලාට එකඟතාවයකට ආවේ නැහැ. මේ පාලම වැටෙන්නේ අපේ ගම්මැද්දේගොඩ නියෝජනය කරන සුභාෂි මන්ත්‍රීතුමියගේ කොට්ඨාශය ආසන්නයේත්, අපේ මායිමට වෙන්නත් තමයි. ඉතිං ඒ නිසා ඒ අවස්ථාව සලසා දීපු සියලු දේශපාලන අධිකාරියට දේශපාලන මතිමතාන්තර මොනව වුනත්, අපේ ගෞරවය, ප්‍රණාමය පුද කරනවා.

තවත් එක කරුණක් ප්‍රකාශ කරනවා. මම මීට කලිනුත් 2019 අවුරුද්දේ යෝජනාවක් ගෙනාවා. පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව මේ මන්ත්‍රීවරු සම්බන්ධ කරගෙන, මේ කාර්ය මණ්ඩලය සම්බන්ධ කරගෙන ප්‍රදේශයේ එක් එක් කොට්ඨාශවලට ඒ කොට්ඨාස වල තියෙන කටයුතු සඳහා මොනව හරි උදව්වක් උපකාරයක් කරන්න පුලුවන්ද කියලා සොයා බලලා, ඒ වෙනුවෙන් කටයුතු කරනවා නම් ගොඩක් වටිනවා. අපට මූල්‍යමය වශයෙන් කරන්න බැරි වුනත්, ගම්වල තියෙන ස්වේච්ඡා සංවිධාන සම්බන්ධ කරගෙන අපි යම්කිසි නායකත්වයක් අරගෙන සභාවෙ තියෙන සම්පත් යොදවා ගෙන එක් මාසයකට එක් කොට්ඨාශයකට හරි ගිහිල්ලා, යම් වැඩපිළිවෙළක් කරන්නට ගරු සභාපතිතුමා ප්‍රධාන පක්ෂ, විපක්ෂ සියළු මන්ත්‍රීවරු සම්බන්ධ කරගෙන ඒ කටයුත්ත කරන්න සියලු දෙනාගේ දායකත්වය ලබාදෙන්න. ඒ සඳහා නායකත්වය ගරු සභාපතිතුමනි, ඔබ තුමාගෙන් ලැබිය යුතුයි. කොට්ඨාස වල මංමාවත් පමණක් නොවෙයි. ඒ වගේ පොදු සුබසාධන කටයුතු සිදුකිරීම සඳහා නව අවුරුද්ද හොඳ වැඩක් කරන්නට මේ වෙලාවෙදි ආරාධනා කරනවා. ඒ සඳහා සියලු දෙනාගේ සහයෝගය අපේක්ෂා කරනවා.

ඒ වගේම උඩවැලිවිටිය කොට්ඨාශය මම නැවත වතාවක් මතක් කරනවා. උඩවැලිවිටිය ප්‍රධාන මාර්ගය මාන වලින් පිරිච්චි ප්‍රදේශයක්. ඒ තණකොළ වර්ගය වඳ කරන්නෙ කොහොමද කියලා මම දන්නෙ නැහැ. මම දැන් තුන් පාරක් විතර කපලා අයින් කරා. නමුත් දැන් අතින් දෙපැත්තට කරගෙන යන තත්ත්වයට පත් වෙලා. j.c.b. යන්ත්‍රයක් දාල උගුල්ලලා දැම්මොත් තමයි ඒ ප්‍රශ්න විසඳගන්න පුළුවන් වෙන්නේ. මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගැනීමට හැකියාවක් තියෙනවා නම්, ඒ ගැන සලකා බලන මෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒවගේම වීථි ලාම්පු සකස් කිරීමේදී වෙනදා තිබුණු ඇල්මැරුණු ස්වභාවය නැති වෙලා පොඩි වේගවත් භාවයක් දැන් දකින්න පුළුවන්. එය ඉතාම හොඳ ප්‍රවණතාවයක්. යම් උපක්‍රමශීලී වැඩපිළිවෙළක් යොදවලා, ඒ කටයුත්ත කරගෙන යනවා. ඒ කාර්යය ඒ විදිහටම සිදුකරලා ඉතාම ඉක්මනින් ප්‍රදේශයේ සියලු විදුලි අවශ්‍යතාවයන් සපුරා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. මම හිතන්නේ අර ශ්‍රමදාන වැඩපිළිවෙල පටන් ගත්තොත් ඔය සියලු දේ වලට විසඳුම ලැබෙනවා. ඒ නිසා ඒ සඳහා සියලු දෙනාට ආරාධනා කරමින්, නැවත වතාවක් සියලුදෙනාටම සුභ අළුත් අවුරුද්දක් සහ සුබ අනාගතයක් ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමනි, සියළුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා, ඒ වගේම ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයෙන් සහ සියලු දෙනාගෙන් අවසරයි. මම මුලින්ම මේ සියළු දෙනාට ලැබුවාවූ 2019 වර්ෂය සාමය, සතුට පිරි සුහම සුභ නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. මම මේ වෙලාවේ දීර්ඝ කතාවක් කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මම වීථි ලාම්පු කිහිපයක් ඉල්ලුම් කළා. එයින් මගේ නිවස ඉදිරිපිටට එකක් ලබා දුන්නා. ඒ සම්බන්ධයෙන් මම ගරු සභාපතිතුමාට ස්තුතිය පුද කරනවා. මම දේශපාලන කරුණු කාරණා කිසිවක් කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. නමුත් යමක් කිව යුතුයි. මේ වෙලාවේ ගාල්ල දිස්ත්‍රික් එක්සත් ජාතික පක්ෂ නායක ගරු වජිර අබේවර්ධන මැතිතුමා, පළාත් පාලන, පළාත් සභා අමාත්‍යවරයා හැටියට ඇමති තනතුරු ලැබුන මේ අවස්ථාවේ ගාල්ල දිස්ත්‍රික්කයේ අතිවිශාල වැඩ කොටසකට නායකත්වය දෙන අපේ දිස්ත්‍රික් නායකතුමාට අපි මේ වෙලාවේ අපේ ප්‍රදේශයේ සියලු දෙනාගේ සුබ පැතුම් සහ පෞද්ගලිකව මගේ සුභ පැතුම් එකතු කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, අපේ නිශාන්ත නන්දන මන්ත්‍රීතුමා සඳහන් කළා වගේම, අපේ හිටපු සභාපති චන්ද්‍ර සහබන්දු මැතිතුමා සඳහන් කළා වගේ, පහුගිය අවුරුද්දේ ඔක්තෝම්බර් 26 වෙනිදා ඉඳලා දින 50 ක යම් රටේ අර්බුදකාරී තත්වයක් තිබුණා. දැන් එය පහව ගිහිල්ලා. 2019 අවුරුද්දේ ජනවාරි මාසයේ ආරම්භ වෙලා තියෙනවා. මම හිතනවා මේ වෙලාවේ අපේ රටට අති විශාල සංවර්ධන ව්‍යාපෘති ඒ වගේම පෞද්ගලිකව අපේ සභාවට ප්‍රතිලාභ ලැබෙන වර්ෂයක් හැටියට අපි සඳහන් කරන්න ඕන. මේ වන විට ඒ සියලු කටයුතු සැලසුම් කරගෙන සිටිනවා. මම හිතනවා දැන් අපට තිබුණු අභියෝග, බාධක නිම වෙලා, ඒ අභියෝග කරපු අයත් දැන් නිහඬ පිළිවෙතක් ගත කරන කාලයක්. කාටත් බලාගන්න පුළුවන් වේවි. 2019 අවුරුද්දේ මේ රටේ ජනතාවට විශාල බලාපොරොත්තු තියන්න පුළුවන් අවුරුද්දක් කියලා මම හිතනවා. අපේ ප්‍රදේශවල ගම්පෙරළිය ඇතුළු සියළු සංවර්ධන කටයුතු ආරම්භ කරනවා. ඉදිරි සති කිහිපය තුළත්, මේ වෙලාවෙත් අපේ දිස්ත්‍රික් නායකතුමා පාලම් කිහිපයක් මුල්ගල් තියෙන අවස්ථාවන් සිදුවෙනවා. අපේ උප සභාපතිතුමන් කිව්වා වගේ පහුගිය කාලේ එතුමන්ගේ කාල වකවානුව තුළත් මේ යෝජනාවන් කරලා තියෙනවා. කරන්න ඇති. නමුත් මේවා කරන්න නම් ඒවට අවශ්‍ය ප්‍රතිපාදන සොයා ගන්න වෙනවා. මම හිතන්නේ ඒක කරන්න පුළුවන් එකම කණ්ඩායම එක්සත් ජාතික පක්ෂයේ මේ අද බිහිවෙලා තියෙන වත්මන් ආණ්ඩුව තමයි. නමුත් පහුගිය කාලේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එක්ක හවුල් ආණ්ඩුවක් කළේ. දැන් මේ වන විට අපි පැහැදිලිව ශක්තිමත් ආණ්ඩුවක් හැටියට ඉදිරියට යන මොහොතේ, මම හිතනවා ඉදිරි කාලය තුළ ඔබතුමන්ලාට දැනගත හැකිවේවි කොහොමද රටේ සංවර්ධනය සිදු වෙන්නේ කියලා. අපට මේ වෙලාවේ එකතු වුණා. හිනිදුම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගාල්ල දිස්ත්‍රික් සංවිධානයේ සභාපතිතුමන් පියසේන ගමගේ හිටපු ඇමතිතුමා, එතුමන් ඇතුලු මනූෂ නානායක්කාර ගරු ඇමතිතුමා, ඒ වගේ අති විශාල පිරිසක් මේ වත්මන් ආණ්ඩුවත් සමග අපේ දිස්ත්‍රික්කයේ ජනතාවගේ සුබසිද්ධිය සඳහා කටයුතු කරනවා. පසුගිය කාලේ මොන මොන දේශපාලන මතිමතාන්තර තිබුණත්, දැන් අපි එකතුවෙලා වැඩ කරන කාලයක්. අපි පක්ෂ පාට නොබලා එකතුවෙලා වැඩ කරමු. මොකද මම දන්නවා සභාපතිතුමා, අපේ ඉඩම් හා පාර්ලිමේන්තු කටයුතු ගරු අමාත්‍ය ගයන්ත කරුණාතිලක මැතිතුමා සමඟ සම්බන්ධවෙලා මේ සභාවේ යම් යම් අවස්ථාවන් වලදී සහයෝගය ඉල්ලලා තියෙනවා. ඉතින් ඒ වගේ සහයෝගය ලබාගන්න නම් මේ යන වැඩපිළිවෙළවලදී අපේ සභාවෙ ඉන්න එක්සත් ජාතික පක්ෂයේ ඇතුලු විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත්, තමන්ගේ කණ්ඩායමේ මන්ත්‍රීවරුන් හා සමාන වරප්‍රසාද ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. මොකද මම එහෙම කියන්නේ තාමත් මට පේනවා. යම් පැත්තකට බරව මේ සභාවේ කටයුතු කෙරෙන ආකාරය. එහෙම නොවී දැන් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක්

තියෙන්නේ. ඒක නිසා ඔබතුමන්ලගේ මන්ත්‍රීවරුන්ට වගේම අපිටත් ඒ පහසුකම් ලබා දෙන්න. අපට වීපී පහන් එකක් දෙනකොට අනිත් අයට හතරක් , පහක් දෙන්න එපා. පුලුවන්නම් ඒ අයට 4,5 ක් දෙනකොට අපටත් ලයිට් තුන හතරක් වත් ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. මම මේ වෙලාවේ මීට වැඩිය කතා කරන්නේ නැහැ. නැවත වාරයක් මේ ලැබුවා වූ නව වර්ෂය ඔබ සියළු දෙනාට සාමය, සතුට පිරි සුභම සුභ නව වසරක් කියලා ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. සියලු දෙනාට තෙරුවන් සරණයි.

### ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා

ගරු සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි, ලේකම්තුමිය, අපේ නිලධාරි මහත්මා ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. කොච්චර කතා නොකර ඉන්න හැදුවත් පොඩ්ඩක් කතා කරන්නම වෙනවා. මොකද අර අපේ ගරු මන්ත්‍රීතුමන් කිව්ව කතාවට තමයි මම මේ කියන්නෙ. මොකද එක පැත්තකට වගේ යනව කියන එක එතුමගේ ප්‍රකාශයෙන් කියවුනා. ඇත්තටම අපට වීපී ලාම්පු දෙකයි හම්බවුනේ. එකත් ජනතා විමුක්ති පෙරමුණ අපේක්ෂක තාරක මහත්මයාගේ ගෙදර දොරකඩ දාලා තියෙන්නේ. අනිත් එක තමයි එතුමට දීලා තියෙන්නේ. එහෙම දීලා තියෙද්දි එතුමාගේ ප්‍රකාශය මම හෙළා දකිනවා. මොකද එහෙම කියන්න එපා. මගෙන් සභාපතිතුමා වීපී පහන් ගැන කතා කරලා ඇහුවම මම කිවුවා එතුමා ඉල්ලනවනම් අනිවාර්යෙන් දෙන්න. මොකද එතුමා මටත් ඉස්සර වෙලා සභාවේ හිටපු මන්ත්‍රීවරයෙක්. ඒ ගෞරවය තියන්න ඕන. ඒ නිසා එතුමාගේ නිවස ඉදිරිපිට වීපී ලාම්පුව ඉස්සෙල්ලා හයි කරලා තමයි විහාරස්ථානයේ පින්කම් මාලාව වෙනුවෙන් යන අනිත් වැඩ කටයුතු කළේ. ඒ නිසා මන්ත්‍රීතුමනි, එහෙම හිතන්න එපා. ඔබතුමාගේ ඒ ඉල්ලීම ඊට පසුවදාම ඉටු කළා. ඒ වගේම අපි ඔක්කොම එකතුවෙලා එක ගමනක් යමු. ඒ වගේ ප්‍රකාශ නොකරන්න කියලා මම ඉල්ලා සිටිනවා. 2019 වර්ෂය සියලු දෙනාට සුබ නව වසරක් වේවා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

### ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා

ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා, මන්ත්‍රීවරුන්ගෙන් හා ලේකම්තුමිය ඇතුළු නිලධාරි මහත්වරුන්ගෙන් අවසරයි. 2019 වසර සියලුම දෙනාට සුබ නව වසරක් වේවායි පතනවා. නාකියාදෙණිය ඔයිල් ෆාම් කම්හල ගැන අපි මීට පෙර සභා වාර වලදීත් කතා කරලා තියෙනවා. අද උදෑසන මට දැනගන්න ලැබුණා ඔයිල් ෆාම් කම්හලේ අපද්‍රව්‍ය බැහැර කරන ටැංකියක් මුදාහැරීම නිසා මාමණදොළ ඇළ මාර්ගය දූෂිත වෙලා, මාළු මැරිලා කියලා. මමත් එතනට ගියා. අපි ඒ වෙලාවේ සියලුම දෙනාට දැනුම්දීම් කලා. උප සභාපතිතුමා පැමිණ සිටියා. සභාව කල් තියලා සියලුම දෙනා එතනට සහභාගි වීම සිදුවිය යුතු වුවත්, එසේ සිදු වුණේ නැහැ. සභාවෙන් පසුව හෝ සියලු දෙනා එතැනට සහභාගි වීම සුදුසු බව තීරණය කිරීම හොඳයි. කම්හලේ පාලන අධිකාරිය ප්‍රාදේශීය සභාව පිලිබඳව භීතියෙන් ඉන්නේ. මොනවගේ ක්‍රියාමාර්ගයක් ගනීවිද කියලා. මොකද එතරම් පරිසර දූෂණයක් සිදු වෙලා තියෙනවා. අපි මීට වඩා ඒ පිළිබඳව වගකීමෙන් කටයුතු කළ යුතුයි කියලා හිතනවා. මාධ්‍ය හරහා මේ පිළිබඳව මුළු රටේම අවධානය යොමු වෙලා තියෙනවා. J.C.B. යන්ත්‍ර යොදවලා, වැටි ගහලා තාවකාලිකව විසඳුම් දුන්නත්, ඒවා සාර්ථක නැහැ. මේ සම්බන්ධව වැඩි අවධානයක් යොමු කර, ඔවුන්ට උපරිම නීතිය ක්‍රියාත්මක කර දඬුවම් දෙන්න ඕන. ඒ සඳහා වගකීම ඇත්තේ ප්‍රාදේශීය සභාවට.

හිටපු සභාපතිවරුන් ප්‍රාදේශීය සභා පෙර පාසල් ළමුන් සඳහා නිල ඇඳුම් කට්ටල දෙකක් නොමිලේ ලබා දුන්නා. පෙර පාසල් වල ඉන්නේ ඉතාමත් දුප්පත් ළමයි. ඔවුන්ට නිල ඇඳුම් කට්ටලයක් ලබාදීම

ලොකු සහනයක් වෙනවා. එනිසා මේ පිළිබඳ ව අවධානය යොමු කිරීම පිළිබඳවද සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

උඩුගම බද්දේගම පාර පසුගිය කාලයේ සංවර්ධනය කරලා වැඩ නතර වුණා. සමාගම් දෙකකින් තමයි මෙය සිදු වුනේ. උඩුගම සිට බෝගහ හන්දිය දක්වා කරන ලද සමාගමේ වැඩ නතර කරලා, ඔවුන් ඉවත් කරලා. මම ඊයේ පලාත් ඉංජිනේරුතුමියට කතා කලා. I ROAD ව්‍යාපෘතිය යටතේ ළඟදීම සංවර්ධනය වන බව මට දැනගන්න ලැබුණා. ඒ පිළිබඳව මේ අවස්ථාවේ සතුට ප්‍රකාශ කරනවා.

හිටපු සභාපති විලේගේ මැතිතුමා අපේ ඉල්ලීම් පිළිබඳ ඇහුම්කන් දීලා කටයුතු කළා. ඔබතුමා ඒවට අවස්ථාව නොදෙනවා නොවෙයි. සුමනසිරි ලියනගේ මැතිතුමාගේ මන්ත්‍රී ප්‍රතිපාදන ලැබිලා තියෙනවා. ඔහුගේ ඉල්ලීම අනුව වීථි පහන් කිහිපයක් හරි ඔබතුමාගෙන් ඉල්ලා සිටියා. ඒ සඳහා දිනයක් ලබා දෙන්න කියලා නැවතත් ඉල්ලා සිටිනවා. වජිර අබේවර්ධන මැතිතුමා අපගේ පළාත් පාලන ඇමැතිවරයා වශයෙන් පත්වෙලා විශාල වැඩ කොටසක් කරන්න ආරම්භ කරලා තියෙනවා. අපේ මන්ත්‍රීවරු මේ බව සඳහන් කළා. අපේ නාගොඩ ප්‍රාදේශීය සභාවට එතුමා 2019 පළමු සතියේ ලක්ෂ 1050 ක මුදලකුත් අරගෙන තමයි ඇවිල්ලා තියෙන්නෙ. ලක්ෂ 300 පාලම් තුනකුත් ලක්ෂ 150 පාලමකුත් ලැබිලා තියෙනවා. උඩුගම ප්‍රදේශයේ පාලම් කීපයක් ආරම්භ කිරීමට හැකියාව ලැබෙනවා. ඒ පිළිබඳව කතා කිරීම සඳහා ඊයේ අපිව කොළඹට කැඳෙව්වා.

මොන මත දැරුවත්, කුමන පක්ෂයෙන් සභාපතිවරු පත්වුණත්, එතුමා විෂය භාර ඇමතිවරයා විදියට උපරිම සහයෝගය ප්‍රාදේශීය සභාවට ලබා දෙනවා. සභාවේ දුප්පත්කම නැති කරන්න, පොලවල්, ක්‍රීඩාපිටි, ළමා උද්‍යාන සංවර්ධනය සඳහා එතුමා උපරිම සහයෝගය ලබා දෙන බව විශ්වාසයි. මන්ත්‍රීවරු ඒ සඳහා මැදිහත්වෙලා ප්‍රාදේශීය සභාවේ අඩුපාඩු සම්පූර්ණ කරගන්න කටයුතු කළ යුතුයි. එතුමාගේ සංවර්ධන වැඩ කටයුතු මේ සභාවට ගේන්න සියලුම මන්ත්‍රීවරුන් එකතුවෙලා වැඩ කරමු කියලා ඉල්ලා සිටිනවා. මගේ තාත්තාගේ එකම සහෝදරයා ජනවාරි පලවෙනිදා හදිසියේ මරණයට පත්වුණා. ඒ අවස්ථාවේ අපගේ දුක බෙදා ගනිපු සභාපතිතුමා, උප සභාපතිතුමා හ සියලුම මන්ත්‍රීවරුන්ට මාගේ ස්තුතිය ප්‍රකාශ කරනවා. ඉදිරියේදී අපට දෙන දීමනාවට සාධාරණයක් ගමට සිදුකරන්න. ඒ සඳහා අප ගැන සිතා අපගේ ඉල්ලීම් වලට ඇහුම්කන් දෙන්න කියලා ඉල්ලා සිටිමින්, සියලු දෙනාට සුබ නව වසරක් ප්‍රාර්ථනා කරමින්, නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු උප සභාපතිතුමා, මන්ත්‍රී තුමන්ලා ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. මම පළමුවෙන්ම ස්තූතිවන්ත වෙනවා. පසුගිය ජනවාරි 01 දින සභාවේ සිදුකළ දානමය පිංකමට සහයෝගය දැක්වූ සියළු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා ඇතුළු නිලධාරීන් සියළුම දෙනාට.

අද මම පළමුවෙන්ම කියන්න ඕන. අපේ ප්‍රෙද්ශයට මහත් ගැටළුවක්ව පවතින කටුපොල් වැවීම සහ එහි අනිටු ප්‍රතිඵලය ගැන. අද උදේ ධනංජය මන්ත්‍රීතුමාගෙන් දුරකථන ඇමතුමක් ලැබුණා. කටුපොල් කර්මාන්තශාලාවේ අපද්‍රව්‍ය ඒ ආශ්‍රිත ඇලට මුදා හැර ඇති බව මම ඒ පිළිබඳව ඒ අවස්ථාවේ අදාළ ආයතනවලට කතා කළා. P.H.I. මහත්තරුන්ට කතා කළා. සිදුවීම ඇත්ත එම ස්ථානයට අපේ උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලා ගොස් පරික්ෂා කර බලලා තියෙනවා. ඒ සම්බන්ධ ඉදිරි නීතිමය කටයුතු කිරීමට බලාපොරොත්තු වෙනවා. කර්මාන්තශාලාවෙන් කිව්වෙ සිදු වී ඇති ප්‍රමාද දෝෂයකින් මෙම අපද්‍රව්‍ය ඇළට මුසු වී ඇති බවයි. නමුත් එය නිදහසට කරුණක් නොවන බව මම පැවසුවා. ජයවීර මන්ත්‍රීතුමාගේ කතාවෙදි කියවුණා. කටුපොල්වලට විරුද්ධ උද්ඝෝෂණයක් යටලමත්ත ප්‍රදේශයෙදි පවත්වනවා. එයට සහභාගි වෙන්න කියලා. නමුත් මම

කියනවා. දැන් අවුරුදු ගණනාවක ඉඳලා මෙයට විරුද්ධව උද්ඝෝෂණ , උපවාස කළා. නමුත් තවම එහි කිසිම ප්‍රතිඵලයක් නැති නිසා තමයි තවමත් මේ ප්‍රශ්ණය ඇදිලා යන්නේ. ඒ නිසා මෙයට මීට වඩා ක්‍රියාමාර්ගයක් ගත යුතු බවයි මාගේ හැඟීම. තවද, අප ප්‍රදේශයේ වැවීමට අවසර දී ඇත්තේ සමාගමට අයත් මුළු බිම් ප්‍රමාණයෙන් 20% ක් වුවත් අප බල ප්‍රදේශයේ බිම් ප්‍රමාණයෙන් 86% ක් කටුපොල් වවා ඇති බවයි අප දැනුවත් වී ඉන්නේ. ඒ නිසා ඒ පිළිබඳව අපි විරෝධය පළ කරනවා. මේ සම්බන්ධව ගාල්ල, කළුතර දිස්ත්‍රික් මහ ලේකම්වරුන්ට මහවැලි සංවර්ධන අධිකාරිය, පරිසර අමාත්‍යාංශය, රබර් පර්යේෂණායතනය, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට පරිසර ඇමතිතුමාගේ අවධානයට යොමු කරලා තියෙනවා. නමුත් තවමත් විසඳුමක් නැති එක තමයි ගැටළුව. මේ හා සමානවම බල ප්‍රදේශයේ කැලි කසල කළමනාකරණය කිරීමේ කටයුතු විධිමත් කිරීම සඳහා සියළුම මන්ත්‍රීවරුන්ගේ සහය මම අපේක්ෂා කරනවා.

2019 ඔක්තෝම්බර් පළවෙනිදා පෙර පාසල් ළමුන් වෙනුවෙන් ළමා දිනය අනුග්‍රාහක හවතුන් සහ ව්‍යාපාරිකයින් සම්බන්ධ කරගෙන ඉහළින්ම සිදු කිරීමට මගේ අදහසක් තියෙනවා. ඒ සඳහා අනුග්‍රාහක හවතුන් ඔබතුමන්ලාටත් පුලුවන්නම් සොයාදෙන්න. ඒ වගේම පෙර පාසල් දරුවන් වෙනුවෙන් 2019 වර්ෂය සඳහා නිල ඇඳුම් එක කට්ටලයක් සභාවෙන් නොමිලේ ලබා දීමට කටයුතු කරනවා. සියලුම ළමයින්ට වතුර බෝතලයක් සහ කෑම පෙට්ටියක් පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් ලබාදීමට කටයුතු කරනවා. ඒ වගේම දෙමව්පියන්ගේ මූල්‍ය ආධාරය ලබා ගෙන ළමයින් පරිසර චාරිකාවක රැගෙන යාමට බලාපොරොත්තු වෙනවා.

අපේ නන්දන මන්ත්‍රීතුමා අද සභාවට පරක්කු වී පැමිණීම පිළිබඳව කතා කළා. හේතුව අද දින නව පළාත් පාලන ඇමති වශයෙන් පත්වී ඇති අපේ ගාල්ල දිස්ත්‍රික්කයේ වජිර අබේවර්ධන ඇමතිතුමාගේ රැස්වීමකට සහභාගි වීම නිසාඒ සඳහා සභාපති හැටියට මටත්, උප සභාපතිතුමාටත්, විපක්ෂනායකතුමාටත් ඊයෙ දුරකථනයෙන් ආරාධනා කළා. නමුත් අද දින සභාව රැස්වීම නිසා මා හට පැමිණිය නොහැකි බව දැන්වුවා. අපි සතුටුවෙනවා ගරු ඇමතිතුමා පළාත් පලාන ආයතනවලට උදව් කිරීම පිළිබඳව. මොකද මම එතුමා පාසල් යන කාලයේ පටන් දන්නවා. එතුමා මහින්ද විදුහලේ, මම රිච්මන්ඩ් විදුහලේ ඉතිං මම හිතනවා. එතුමා අපට උදව් කරයි කියලා. දැනටමත් අප ප්‍රදේශයේ පාලම් තැනීඹ සඳහා කෝටි 30කට ආසන්න මුදලක් වෙන් කර ඇති බව දැනගැනීම සතුටක් මේ අවස්ථාවෙ මට මතක් වෙනවා අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මාගේ ඉල්ලීමකට නාගොඩ ගම්මැද්දේගොඩ යාකල පාලම රු. කෝටි 100 කට එහා මුදලක් යොදවා ඉදි කර දුන්නා. අද එහි ප්‍රතිඵලය අපි භුක්ති විඳිනවා.

ඒ වගේම ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමාට ඉඩම් ඇමති ධූරය ලැබීම පිළිබඳව අපි සතුටු වෙනවා. මන්ද එතුමා අපේ සභාවට අඩුපාඩුවක්ව පවතින ආදාහනාගාරය ඉදිකිරීමට අවශ්‍ය ඉඩම් ලබා දීම සහ සභාවට තවත් ඉඩම් ලබා දීමට කටයුතු කළා. එතුමා අපි පොඩි දවස්වල සිට දන්නා හඳුනන ඇමතිවරයෙකු නිසා එතුමාගේ සහයෝගයද අපට නිසැකවම ලබා දෙන බව මට විශ්වාසයි. ඒ වගේම උඩුගම ඇප්තොප්වත්ත, උප කාරයාලය නීත්‍යානුකූලව සභාවට පවරා ගැනීමටත් අවශ්‍ය කටයුතු සිදු කරනවා.

තවද අපේ මන්ත්‍රීවරුන්ගේ ප්‍රධාන ඉල්ලීමක් වන වීථි පහන් පිළිබඳව ක්‍රමානුකූල වැඩපිළිවෙලක් දැන් ක්‍රියාත්මකයි. කවුරුත් හිතන්න එපා මම මන්ත්‍රීවරුන්ට වෙනස් වෙනස් විදියට සළකනවා කියලා. එලිය කාටත් පොදුයි. ඒ වගේම පාරවල්වලට කම්කරුවන් යොදවලා වැඩ කරන්න අපිට කම්කරුවන් ප්‍රමාණවත් නැහැ. ගමේ ශ්‍රමදාන මට්ටමින් වැඩ කටයුතු කරනවානම් අපෙන් ලබා දිය හැකි සහයෝගය ලබාදීමට කටයුතු කරනවා.

උඩුගම පෙරහරේ කටයුතු අපි ඉටු කරනවා. වාහන ලබා දීම නම් අපහසුයි. සභාවේ සංවර්ධන කටයුතු කරනකොට යෝජනා අනුමැතිය විධිමත්ව ලබා ගත යුතුයි. අපේ ප්‍රාදේශීය සභාවේ කිසිදු ගැටලුවක් නැතිව පවත්වාගෙන යන හොඳ මන්ත්‍රීවරු පිරිසක් සිටීම පිළිබඳව මම සතුටු වෙනවා. පසුගිය අයවැය සඳහා පක්ෂ විපක්ෂව ඡන්දය දුන්නත්, සියලුම දෙනා මට එක හා සමානව තමයි සලකන්නේ. අයවැය පණිවිඩය සඳහා යම් මැතිඇමතිවරුන්ගේ නම් සඳහන් වුනේ නැහැ. මම එය සංශෝධනය කළා. ඔබතුමන්ලා සියලු දෙනා මැති ඇමතිවරුන්ගේ ප්‍රතිපාදන ලබා ගෙන බල ප්‍රදේශයේ යම් වැඩක් කරන්න උත්සාහ කරන්න කියා ඉල්ලනවා. ඒ සඳහා ඔබ සියලු දෙනාට ධෛර්ය, ශක්තිය ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් මගේ මූලාසන කතාව මින් අවසන් කරනවා. සියළු දෙනාට සම්බුදු සරණයි. ස්තුතියි.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී                                    දිනය :-